# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,483 - 2026 අප්‍රේල් මස 02 බ්‍රහස්පතින්දා - 2026.04.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී. )

# IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත. )


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය . . . . . . | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය . . . . . . | — |
| වෙනත් පත්කිරීම් . . . . . . | — |
| පළාත් සභා නිවේදන . . . . . . | — |
| අතුරු ව්‍යවස්ථා . . . . . . | — |
| තනතුරු ඇබෑර්තු . . . . . . | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය . . . . . . | 494 |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් . . . . . . | — |
| බඩු බාහිරාදිය විකිණීම් . . . . . . | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් . . . . . . | — |
| විවිධ දැන්වීම් | |


**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට මසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 අප්‍රේල් මස 24 දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 අප්‍රේල් මස 10 වැනි දින දහවල් 12. 00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට්* පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය. "

2026 අප්‍රේල් මස 02 දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

ප්‍රසන්න ජයරත්න,
රජයේ මුද්‍රණාලයාධිපති.

මෙම *ගැසට් පත්‍රය www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව - ඌව පළාත් සභාව

### ක්ෂේත්‍ර සහයක (කෘෂිකර්ම) පුහුණු පාඨමාලාව ජාතික වෘත්තීය සුදුසුකම් 4 මට්ටම (NVQ 4) - 2026 - I

01. ඉහත පුහුණු පාඨමාලාව සඳහා සුදුසුකම්ලත් සිසුන් බඳවා ගැනීම සඳහා, දීප ව්‍යාප්තව ඌව පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ විසින් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම පුහුණු පාඨමාලාව ඌව පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ පවතින බිබිල දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානයේ දී පවත්වනු ලැබේ.

02. මෙම පුහුණු පාඨමාලාව සිංහල මාධ්‍යයෙන් පවත්වනු ලබන එක් වසරක පූර්ණ කාලීන පුහුණු පාඨමාලාවක් වන අතර මාස 06ක න්‍යායාත්මක පුහුණුවක් සහ මාස 06ක ඌව පළාත තුළ කර්මාන්තගත ප්‍රායෝගික පුහුණුවකින් සමන්විත වේ. මෙම පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කරන පුහුණුලාභීන්ට පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සහතිකයක් හා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිරිනමනු ලබන NVQ Level 4 සහතික පත්‍රය ප්‍රදානය කරනු ලැබේ.

03. කෘෂිකර්මාන්තය ව්‍යාපාරයක් වශයෙන් කිරීමට හෝ ස්වයං රැකියාවක නියැලීමට අදහස් කරන අය සඳහා මෙම පුහුණු පාඨමාලාව ඉලක්ක කර ඇත. ජාතික වෘත්තීය නිපුණතා 5 මට්ටමේ අදාළ පාඨමාලාවක සිට ඉදිරියට ඉගෙනීම සඳහා මෙම ජාතික වෘත්තීය නිපුණතා මට්ටමට 4 මූලික සුදුසුකමක් වනු ඇත.

04. ක්ෂේත්‍ර සහයක (කෘෂිකර්ම) පුහුණු පාඨමාලාව ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ 4) පාඨමාලාවේ විෂයය නිර්දේශය පහත පරිදි වේ :

- m - 01 කෘෂිකර්මයේ මූලික සිද්ධාන්ත (Fundamentals of Agriculture)
- m - 02 වී හා අනෙකුත් ධාන්‍ය වර්ග ස්ථාපිත කිරීම හා නඩත්තු කිරීම (Establishment and Maintenance of Paddy and Other Cereals)
- m - 03 වෙනත් ක්ෂේත්‍ර බෝග ස්ථාපිත කිරීම හා නඩත්තු කිරීම (Establishment and Maintenance of Other field Crops - OFC)
- m - 04 උද්‍යාන බෝග ස්ථාපිත කිරීම හා නඩත්තු කිරීම (Establishment and Maintenance of Horticultural Crops)
- m - 05 අස්වනු නෙලීම හා ප්‍රාථමික සැකසුම් (Harvesting and Primary Processing)
- m - 06 ගොවිපළ යන්ත්‍රෝපකරණ, උපකරණ හා මෙවලම් නඩත්තුව (Maintenance of Farm Machineries, Equipment and Tools)
- m - 07 කෘෂි ව්‍යාප්ති වැඩසටහන් ක්‍රියාත්මක කිරීම (Implementation of Agricultural Extension Programme)
- m - 08 ආයතනික සන්නිවේදන කුසලතා (Communication Skills for Workplace)
- m - 09 භාෂා සාක්ෂරතාවය හා සංඛ්‍යාත්මක දැනුම (Language Literacy and Numeracy)
- m -10 කණ්ඩායම් ක්‍රියාකාරකම් (Team work)
- m - 11 වෘත්තීය සෞඛ්‍ය හා ආරක්ෂක ක්‍රියාපටිපාටි හා භාවිතයන් (Occupational Health and Safety Procedures and Practice)

05. 2026 වසරේ පළමුවන කණ්ඩායම **2026 අප්‍රේල් මස** අවසන් සතිය තුළ බඳවා ගැනීමට බලාපොරොත්තු වේ. මෙම පාඨමාලාවට අයදුම් කරන, අයදුම්කරුවන් අඟල් 8x12 (A4) ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තේම මුද්‍රණය කරන ලද අමුණා ඇති ආකෘතිය ප්‍රකාරව සකස් කළ අයදුම්පත්‍ර **2026 අප්‍රේල් මස 24 දිනට පෙර** පහත ලිපිනයට ලියාපදිංචි තැපැල් මගින් යොමුකළ යුතුය. අයදුම්පත් එවීමේ දී ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ **" NVQ 4 මට්ටමේ පාඨමාලාව සඳහා අයදුම්පත් - 2026 - I"** ලෙස සඳහන් කළ යුතු ය. අසම්පූර්ණ හෝ අපිළිවෙලට එවා ඇති අයදුම්පත්‍ර කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

06. *අයදුම්පත් එවිය යුතු ලිපිනය.-* ඌව පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ, ඌව පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, රත්වත්ත මාවත, බදුල්ල.

07. ලැබෙන අයදුම්පත් සංඛ්‍යාව අනුව තරඟ විභාගයක් පැවැත්වීම හෝ සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වීම මගින් පුහුණු පාඨමාලාවට බඳවා ගැනීම ඌව පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ විසින් තීරණය කරනු ලැබේ.

සුදුසුකම් ලබන අයදුම්කරුවන් අතුරින් පාඨමාලාව සඳහා බඳවා ගත යුතු ප්‍රමාණය මෙන් දෙගුණයක් සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවා සම්මුඛ පරීක්ෂණයෙන් ඉහළම සුදුසුකම් ලබන අයදුම්කරුවන් තෝරා ගනු ලැබේ.

අදාළ තරග විභාගය/සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන දිනයන් ලිඛිතව email මගින් අයදුම්කරුවන් වෙත දැනුම් දෙනු ලබන අතර, ඌව පළාත් සභා වෙබ් අඩවියට පිවිසීමෙන් මේ පිළිබඳව දැනුවත් විය හැක.

08. මෙම පාඨමාලාව සම්බන්ධ වැඩිදුර විස්තර 055 2265423 දුරකථන අංකය ඔස්සේ බිබිල දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානයේ ගොවිපළ කළමනාකරු වෙතින් ලබාගත හැක.

09. *පාඨමාලාවට අයදුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් :*

9.1 අධ්‍යාපන සුදුසුකම් :- අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් 02 කට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 06කින් සමත් වී තිබීම ;

අ.පො.ස. (උ.පෙළ) විභාගය සඳහා කෘෂිකර්ම විෂය හදාරා තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

9.2 වෙනත් සුදුසුකම් :

i. සියලුම අයදුම්කරුවන් අයදුම්පත් කැඳවන දිනට වයස අවුරුදු 18 - 40 ත් අතර විය යුතුය.

ii. පදිංචිය පිළිබඳ ග්‍රාම නිලධාරි සහතිකය සහ චරිත සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.

10. *පුහුණු පාඨමාලාව සඳහා දිරි දීමනාව :*

i. බිබිල දිස්ත්‍රික් ගොවි පුහුණු මධ්‍යස්ථානයේ පුහුණුව පැවැත්වෙන මුල් මාස 6 දී පුහුණුව පැවැත්වෙන සෑම දිනක් සඳහාම ඊට සහභාගිවන එක් එක් අභ්‍යාසලාභියාට, රුපියල් දාහක් (රු. 1,000.00) බැගින් දීමනාවක් ගෙවනු ලැබේ. කර්මාන්තගත පුහුණු මාස 6 සඳහා ඌව පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් දීමනාවක් ගෙවනු නොලැබේ.

11. *වෙනත් කරුණු :*

i. මෙම පාඨමාලාව සඳහා 25 දෙනෙකු බඳවා ගැනේ.

ii. පුහුණුව අවසානයේ ආපසු ගෙවනු ලබන රු. 1,000.00 ක ඇප තැන්පතුවක් අභ්‍යාසලාභීන් විසින් පුහුණුව සඳහා ලියාපදිංචි වන දිනයේ දී දෙපාර්තමේන්තුවේ ගිණුමට තැන්පත් කළ යුතුය. පාඨමාලාව සම්පූර්ණ නොකරන්නේ නම් එම මුදල නැවත ගෙවනු නොලැබේ.

iii. පුහුණු කාලය තුළ ඌව පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් නේවාසික පහසුකම් හෝ ආහාර පාන ලබා දීම සිදු නොකෙරේ.

iv. පුහුණුව අවසන් කළ පසු රැකියා ලබා දීමට ඌව පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව බැඳී නොමැත.

v. කිසියම් විනය විරෝධී ක්‍රියාවකට සම්බන්ධ වීම හෝ අනුබල දීමට වැරදිකරු වේ නම්, ශිෂ්‍යභාවය අවලංගු කිරීමට බලධාරීන් පියවර ගනු ලැබේ.

11. *සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු සහතික :*

i. පදිංචිය සනාථ කිරීමට ග්‍රාම නිලධාරි සහතිකය,

ii. චරිත සහතික 2ක් ඉදිරිපත් කළ යුතු අතර, එක් සහතිකයක් රාජ්‍ය සේවයේ නියුතු මාණ්ඩලික නිලධාරියෙකුගෙන් ලබා ගත යුතුය,

iii. සම්මුඛ පරීක්ෂණයේ දී ජාතික හැඳුනුම්පත සමඟ අධ්‍යාපන හා වෙනත් සහතිකවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය. ලියාපදිංචි වන අවස්ථාවේ මෙම සහතිකවල ඡායා පිටපතක් ද ඉදිරිපත් කළ යුතුය.

12. අයදුම්කරුවන් ප්‍රායෝගික කෘෂිකර්මාන්තයට සුදුසු ශාරීරික හා මානසික තත්ත්වයක සිටින බවට රජයේ වෛද්‍ය නිලධාරියෙකුගෙන් ලබාගත් වෛද්‍ය සහතිකයක් මගින් පාඨමාලාව සඳහා ලියාපදිංචිවන දිනයේ සනාථ කළ යුතුය.

එච්. කේ. ජී. ජයලත්,
ඌව පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ.

2026 මාර්තු මස 30 දින,
ඌව පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
රත්වත්ත මාවත,
බදුල්ල.

## ආදර්ශ අයදුම්පත්‍රය

ක්ෂේත්‍ර සහයක (කෘෂිකර්ම) පාඨමාලාව (NVQ 4) ඌව පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

01. (i) සම්පූර්ණ නම :..............................................................................................
(සිංහලෙන්)

(ii) සම්පූර්ණ නම :..............................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

(iii) මුලකුරු සමග නම :..............................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

02. ස්ත්‍රී/පුරුෂ භාවය : ..........................................

03. (i) ස්ථිර ලිපිනය :..............................................................................................
(සිංහලෙන්)

(ii) ස්ථිර ලිපිනය :..............................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

(iii) දුරකථන අංක : නිවස :.................................... ජංගම :....................................

(iv) විද්‍යුත් තැපැල් ලිපිනය :..............................................................................................
(සක්‍රිය ලිපිනයක් විය යුතුයි)

(v) WhatsApp අංකය :.......................................................................

04. (i) උපන්දිනය :...........................................

(ii) අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස : අවුරුදු :..................... මාස : ..................... දින :.........................

05. ජාතික හැඳුනුම්පත් අංකය :................................................

06. පදිංචිය පිළිබඳ විස්තර :

(i) පදිංචි දිස්ත්‍රික්කය :.....................................................
(ii) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :.....................................................
(iii) ග්‍රාම නිලධාරි කොට්ඨාසය :.....................................................
(iv) ඌව පළාතේ පදිංචි කාලය :.....................................................

07. අධ්‍යාපන සුදුසුකම් :

(i) අ. පො. ස. (සා. පෙළ) විභාගය :

වර්ෂය :.................. විභාග අංකය :........................

| විෂයය | සාමාර්ථය |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

වර්ෂය :.................. විභාග අංකය :........................

| විෂයය | සාමාර්ථය |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

(ii) අ. පො. ස. (උ. පෙළ) විභාගය :

වර්ෂය :.................. විභාග අංකය :............................. වර්ෂය :.................. විභාග අංකය :.............................

| විෂයය | සාමාර්ථය |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |

| විෂයය | සාමාර්ථය |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |

(iii) වෙනත් සුදුසුකම් : ....................................................................................................................................
....................................................................................................................................
....................................................................................................................................

08. හදිසි අවශ්‍යතාවයක දී දැනුම් දිය යුතු පුද්ගලයකුගේ විස්තර :

(i) නම :..............................................................................................
(ii) අයදුම්කරුට ඇති සම්බන්ධතාවය :...................................................
(iii) ලිපිනය :.........................................................................................
(iv) දුරකථන අංකය : ජංගම :………..............……………  නිවස :…………………......……….

ඉහත දැක්වූ තොරතුරු සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි. වැරදි හෝ අසත්‍ය තොරතුරු ඉදිරිපත් කළ බව මා තෝරා ගැනීමෙන් පසු හෙළිවුවහොත් මාගේ ශිෂ්‍යභාවය අහෝසිවන බවත්, ඒ සම්බන්ධයෙන් නියම කරන ලද දඩ මුදලක් ගෙවීමට මා එකඟ වන බව මම තේරුම් ගත්තෙමි.

....................................,
අයදුම්කරුගේ අත්සන.

දිනය :..........................

04 - 103

---

**බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරී (සිවිල්) III ශ්‍රේණිය, පුහුණු ශ්‍රේණිය (එක් වසරක පුහුණු කාලය) සහ පුහුණු ශ්‍රේණිය (දෙවසරක පුහුණු කාලය) සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026

01. බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ පහත තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා බස්නාහිර පළාතේ වසර තුනක (03) අඛණ්ඩ ස්ථිර පදිංචිය ඇති පහත සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම බඳවා ගැනීමේ විවෘත තරග විභාගය, බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් ඉදිරි යෝජිත දිනයක දී පැවැත්වීමට නියමිතය. විභාගය පවත්වන දිනය පසුව දැනුම් දෙනු ලැබේ.

I. බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරී (සිවිල්) III ශ්‍රේණිය
II. බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරී (සිවිල්) (එක් වසරක පුහුණු කාලය)
III. බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරී (සිවිල්) (දෙවසරක පුහුණු කාලය)

**02. පොදු සුදුසුකම් :-**

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
II. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
III. යම් ආගමක නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තෙකු මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.

IV. අයදුම්පත් කැඳවන අවසාන දිනට පූර්වාසන්න වසර තුනක් (03) තුළ බස්නාහිර පළාතේ අඛණ්ඩ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.

V. සේවයට බඳවා ගැනීම සඳහාවන තරඟ විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු අදාළ සියලු සුදුසුකම් හා නියමිත වයස් සීමාව අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

VI. අයදුම්කරු බස්නාහිර පළාත තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

**03. වයස් සීමාව :-**

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට එනම් **2026.05.10** දිනට වයස අවුරුදු **18** ට නොඅඩු හා අවුරුදු **30** ට නොවැඩි විය යුතුය.

**04. සේවා කොන්දේසි :-**

(අ) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. තවද ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය මඟින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

(ආ) රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, 2020.06.24 දිනැතිව බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරී (සිවිල්) තනතුරට බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියේ පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද, එම බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියේ කර ඇති හෝ මින්මතු කෙරෙන සංශෝධන වලට ද, ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි විධිවිධානවලට ද, අංක 2364/32 සහ 2023.12.29 දින දරන අති විශේෂ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලට ද යටත් විය යුතු වේ.

(ඇ) මෙම පත්වීම අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වේ. තාක්ෂණ නිලධාරී (සිවිල්) III ශ්‍රේණියේ තනතුරකට බඳවා ගෙන වසර තුනක් (03) ඇතුළත බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියේ සඳහන් පරිදි පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

(ඈ) 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 හා එයට වරින් වර සිදු කරන සංශෝධනයන්ට අනුව නියම කර ඇති පරිදි දෙවන රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාවය ලබා ගත යුතුය.

**05. පුරප්පාඩු ප්‍රමාණය :- 170**

**06. පවත්නා පුරප්පාඩු ක්ෂේත්‍රයන් :-**

ඉහත සඳහන් තනතුරුවල පුරප්පාඩු සඳහා බඳවා ගැනීම සම්බන්ධයෙන් අවසාන තීරණය බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

**6.1** අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනය **2026.05.10** දින වේ. අයදුම් කරන තනතුරට අදාල සියලු සුදුසුකම් **2026.05.10** දින හෝ එදිනට පෙර සම්පූර්ණ කර තිබිය යුතුයි.

**07. ආබාධ සහිත පුද්ගලයින් අයදුම් කිරීම:-**

මෙම තරග විභාගය මඟින් සම්පූර්ණ කිරීමට නියමිත පුරප්පාඩු සංඛ්‍යාවෙන් 3% ක් ආබාධ සහිත පුද්ගලයන් සඳහා වෙන් කෙරෙනු ඇත. විභාගයේ දී සුදුසුකම් ලබන ආබාධිත අයදුම්කරුවන් අතුරින් ඉහළ ලකුණු මට්ටමේ 3% ක ප්‍රතිශතයක් පමණක් කුසලතා අනුපිළිවෙල අනුව පත්වීම් ලබා දීම සඳහා තෝරා ගැනෙනු ඇත. මේ සඳහා සුදුසුකම් ලැබීමට විභාගයේ එක් එක් විෂයය සඳහා වෙන් කර ඇති ලකුණුවලින් යටත් පිරිසෙයින් සියයට හතළිහක්වත් (40%) අපේක්ෂකයින් විසින් ලබා ගත යුතුය. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 27/88 හි විධිවිධාන, ආබාධිත පදනමින් බඳවා ගැනීම සඳහා අදාළ වේ.

ආබාධ සහිත පුද්ගලයන් සඳහා වෙන් කෙරෙන පුරප්පාඩු සඳහා අයදුම් කර සම්මුඛ පරීක්ෂණය සඳහා සුදුසුකම් ලබන අයදුම්කරුවන්, සුදුසුකම් පරීක්ෂා කිරීමේ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වීමේදී වෛද්‍ය සහතික (ආබාධිත බව තහවුරු

කිරිම සඳහා) ඉදිරිපත් කළ යුතු අතර, ආබාධිත අයදුම්කරුවෙකු නොවන බවට හෝ ආබාධිත පදනම යටතේ පත්වීමක් ලබා දීමට සුදුසුකම් නොලබන බවට නිර්දේශ කරන අයදුම්කරුවන් පත්වීමක් සඳහා සුදුසුකම් නොලබන බව සැලකිය යුතු වේ.

**සටහන -** මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමේදී අදාළ පරිදි තමා ආබාධිත කොන්දේසි යටතේ අයදුම් කරන බව සඳහන් කළ යුතු අතර, **ආබාධිත නොවන අයකු සාවද්‍ය ලෙස ආබාධිත යැයි සඳහන් නොකළ යුතුය.**

**ආබාධ සහිත පුද්ගලයන් නොමැති විට මෙම පුරප්පාඩු ප්‍රමාණය සාමාන්‍ය අයදුම්කරුවන්ගෙන් සම්පූර්ණ කරනු ලැබේ.**

**08.** බඳවා ගැනීමේ ක්‍රමය :

- ලිඛිත තරඟ විභාගයක සහ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුස්සන් තෝරනු ලැබේ.

- ලිඛිත තරඟ විභාගයේ ප්‍රතිඵල අනුව සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා වන සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවන අයදුම්කරුවන් නියමිත දිනයේදී සහභාගී නොවීම සම්බන්ධයෙන් කිසිදු අයුරකින් නැවත සලකා බලනු නොලැබේ. එමෙන්ම සම්මුඛ පරීක්ෂණ දිනට සියළු සහතික ඉදිරිපත් කළ යුතු අතර, එදිනට පසුව ඉදිරිපත් කරනු ලබන කිසිදු සහතික භාර ගනු නොලැබේ.

- පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය පත්වීම් බලධරයා විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීමට පත්වීම් බලධරයාට බලය ඇත. කිසියම් අවස්ථාවක පුරප්පාඩු සම්පූර්ණ කරන කඩඉම් ලකුණේ සම ලකුණු ලබා ගත් අයදුම්කරුවන් කිහිප දෙනෙක් සිටින අවස්ථාවක එම පුරප්පාඩු සංඛ්‍යාව පිරවීම සඳහා කඩඉම් ලකුණේ සම ලකුණු ලබා ගත් අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයකට ලක් කර එහි කුසලතාව මත එම පුරප්පාඩු ප්‍රමාණය සම්පූර්ණ කරනු ලැබේ.

- සීමිත තරග විභාගයෙන් බඳවා ගැනීමට නියමිත ප්‍රතිශතය සඳහා ප්‍රමාණවත් මූලික සුදුසුකම් සහිත අභ්‍යන්තර අයදුම්කරුවන් අදාළ දෙපාර්තමේන්තුව/ අමාත්‍යාංශය තුළ නොසිටී නම් පමණක් ඉතිරි ප්‍රමාණය විවෘත තරග විභාගය මගින්ම තෝරා ගන්නා බාහිර අයදුම්කරුවන්ගෙන්ම සම්පූර්ණ කර ගනු ලැබේ.

- පුහුණු කාලසීමාව අවසානයේදී III ශ්‍රේණියට බඳවා ගැනීම.

  (අ) විවෘත ධාරාව හෝ සීමිත ධාරාව හෝ යටතේ පුහුණු කිරීමේ ශ්‍රේණියට ඇතුළත් කරගනු ලබන අයදුම්කරුවන් අදාළ බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් පුහුණු කාලසීමාව සාර්ථක ලෙස සම්පූර්ණ කිරීමෙන් අනතුරුව බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන විභාගය සමත් වීමෙන් පසු සේවයේ III ශ්‍රේණියට බඳවා ගනු ලැබේ.

  (ආ) පුහුණුව අවසානයේ පවත්වනු ලබන විභාගය සමත් වීමට අපොහොසත් වන ආධුනිකයින් වෙතොත් ඔවුනට මාස 06 කට නොවැඩි කාලයක් සඳහා සිය පුහුණු කාලය දීර්ඝ කරවා ගැනීමට අවස්ථාව ඇත. එසේ දීර්ඝ කරනු ලබන කාල සීමාව අවසානයේ නැවත පවත්වනු ලබන විභාගය අසමත් වන විවෘත ධාරාව යටතේ අයදුම්කළ ආධුනිකයන්ගේ සේවය අවසන් කරනු ලැබේ.

09. මාසික වැටුප් පරිමාණය :-

- III ශ්‍රේණිය - MN 03 – 2025
  රු. 52,250 - 10 X 800 - 11X 1,190- 10 X 1,320 -10X1,350 - රු. 100,040/-
  (රා.පරි.ච. 10/2025 හි උපලේඛන III අනුව ගෙවනු ලැබේ.)

- පුහුණු ශ්‍රේණිය (එක් වසරක පුහුණු කාලය) - 2026.01.01 දිනට වන මාසික දීමනාව රු.43,274/-

- පුහුණු ශ්‍රේණිය (දෙවසරක පුහුණු කාලය) - 2026.01.01 දිනට වන මාසික දීමනාව රු.43,730/-
  (මාසික දීමනා රා.පරි.ච.10/2025 හි උපලේඛන VI අනුව ගෙවනු ලැබේ.)

**10. මූලික සුදුසුකම් :-**

| *තනතුර* | *සුදුසුකම්* |
|---|---|
| **බස්නාහිර පළාත් සහා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ (සිවිල්)**<br>➢ III ශ්‍රේණිය | **(අ) අධ්‍යාපන සුදුසුකම් :**<br><br>අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී විද්‍යා/ගණිත විෂය ධාරාව යටතේ රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සංයුක්ත ගණිතය යන විෂයන් අතුරින් විෂයන් දෙකක් සහිතව විෂයයන් තුනකින් එකවර සමත්ව තිබීම හෝ තාක්ෂණවේදය විෂය ධාරාව යටතේ ඉංජිනේරු තාක්ෂණවේදය, තාක්ෂණවේදය සඳහා විද්‍යාව, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යන විෂයයන් අතුරින් විෂයයන් දෙකක් සහිතව විෂයයන් තුනකින් එකවර සමත්වීම ;<br>*සහ*<br>සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගය සමත්ව තිබීම.<br><br>**(ආ) වෘත්තීය සුදුසුකම් :**<br><br>1. මොරටුව විශ්ව විද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික (සිවිල්) ඩිප්ලෝමාව ;<br>*හෝ*<br>2. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව (සිවිල්) ;<br>*හෝ*<br>3. අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව (සිවිල්) ;<br>*හෝ*<br>4. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව (සිවිල්) ;<br>*හෝ*<br>5. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ පළමු වන කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම ;<br>*හෝ*<br>6. රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 06 වන මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම ;<br>7. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියළු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම. |

| | |
|---|---|
| ➢ පුහුණු ශ්‍රේණිය (එක් වසරක පුහුණු කාලය) | **(අ) අධ්‍යාපන සුදුසුකම්**<br><br>අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී විද්‍යා/ගණිත විෂය ධාරාව යටතේ රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සංයුක්ත ගණිතය යන විෂයන් අතුරින් විෂයන් දෙකක් සහිතව විෂයයන් තුනකින් එකවර සමත්ව තිබීම හෝ තාක්‍ෂණවේදය විෂය ධාරාව යටතේ ඉංජිනේරු තාක්‍ෂණවේදය, තාක්‍ෂණවේදය සඳහා විද්‍යාව, තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණය යන විෂයයන් අතුරින් විෂයයන් දෙකක් සහිතව විෂයයන් තුනකින් එකවර සමත්වීම ;<br><br>*සහ*<br><br>සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගය සමත්ව තිබීම.<br><br>**(ආ) වෘත්තීය සුදුසුකම්**<br><br>01. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක සිවිල් ක්ෂේත්‍රයේ වසර 03 ක පාඨමාලාවක් සාර්ථකව හදාරා ජාතික තාක්‍ෂණ සහතිකය (සිවිල්) ලබා තිබීම ;<br><br>*හෝ*<br><br>02. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක සිවිල් ක්ෂේත්‍රයේ කර්මාන්ත තාක්‍ෂණිකයන් සඳහා වූ වසර 02ක ජාතික සහතික පත්‍ර පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර අදාල සහතිකය ලබා තිබීම ;<br><br>*හෝ*<br><br>03. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්‍ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්‍ෂණික සුදුසුකම් වලට සියළු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්‍ෂණික සුදුසුකම් ලබා තිබීම. |
| ➢ පුහුණු ශ්‍රේණිය (දෙවසරක පුහුණු කාලය) | **(අ) අධ්‍යාපන සුදුසුකම් :**<br><br>අ.පො.ස. (උ.පෙළ) විභාගයේදී විද්‍යා/ගණිත විෂය ධාරාව යටතේ රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, සංයුක්ත ගණිතය යන විෂයන් අතුරින් විෂයන් දෙකක් සහිතව විෂයයන් තුනකින් එකවර සමත්ව තිබීම හෝ තාක්‍ෂණවේදය විෂය ධාරාව යටතේ ඉංජිනේරු තාක්‍ෂණවේදය, තාක්‍ෂණවේදය සඳහා විද්‍යාව, තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණය යන විෂයයන් අතුරින් විෂයයන් දෙකක් සහිතව විෂයයන් තුනකින් එකවර සමත්වීම ;<br><br>*සහ*<br><br>සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව , විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හය (06) කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගය සමත්ව තිබීම. |

සටහන :

i) III ශ්‍රේණියට සෘජුව බඳවා ගැනීම සහ පුහුණු ශ්‍රේණියට බඳවා ගැනීම යන ක්‍රම දෙකින්ම බඳවා ගන්නා විට බඳවා ගැනීමේ ශ්‍රේණිය වන III ශ්‍රේණියට පළමුව බඳවා ගනු ලැබේ.

ii) III ශ්‍රේණියට සුදුසුකම් ලබන අයදුම්කරුවන් සංඛ්‍යාව පුරප්පාඩු සංඛ්‍යාවට ප්‍රමාණවත් නොවන විට, ඉතිරි පුරප්පාඩු සඳහා පුහුණු ශ්‍රේණියට අදාළ සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් පුහුණු කිරීමේ ශ්‍රේණියට ඇතුළත් කර ගනු ලැබේ.

iii) පුහුණු ශ්‍රේණිය එක් වසරක පුහුණු කාලය හා දෙවසරක පුහුණු කාලය අවසානයේ පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයේ ලකුණු පදනම් කර ගනිමින් III ශ්‍රේණියට පත්කිරීමේදී ජොෂ්ඨත්වය තීරණය කරනු ලබයි.

**11. ලිඛිත තරග විභාගය පිළිබඳ විස්තර :**

❖ **පුහුණු කිරීමේ ශ්‍රේණිය (එක් වසරක පුහුණුව සඳහා) සහ III ශ්‍රේණිය සඳහා**

| *විෂයය සහ විෂය නිර්දේශය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| **බුද්ධි පරීක්ෂණය :**<br><br>අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාවයත්, ඔහුගේ සිතීමේ විශ්ලේෂණ තත්වයත් තීරණය කිරීමේ ශක්තියත්, විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්න වලින් යුක්තය. | පැය 01 | 100 | 40% |
| **තාක්ෂණික හැකියාව :**<br><br>ගොඩනැගිලි, මාර්ග හා වාරිමාර්ග ඉදිකිරීමේ මූලධර්ම, ඉදිකිරීම් කාර්ය සඳහා පිඹුරුපත් සකස් කිරීම හා කියවා වටහා ගැනීමේ හැකියාව, ඇස්තමේන්තු පිළියෙල කිරීමේ හැකියාව, ජල සැපයීම, ජල ප්‍රවාහන ක්‍රියාමාර්ග හා අපද්‍රව්‍ය බැහැර කිරීමේ ක්‍රියා පිළිවෙල පිළිබඳව අපේක්ෂකයා සතු අත්පත් කර ගත යුතු හැකියාවන් විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් යුක්ත වේ. | පැය 03 | 100 | 40% |

❖ **පුහුණු කිරීමේ ශ්‍රේණිය (දෙවසරක පුහුණුව සඳහා)**

| *විෂයය සහ විෂය නිර්දේශය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| **බුද්ධි පරීක්ෂණය**<br><br>අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාවයත්, ඔහුගේ සිතීමේ විශ්ලේෂණ තත්වයත් තීරණය කිරීමේ ශක්තියත්, විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්න වලින් යුක්තය. | පැය 02 | 100 | 40% |

**12.** විභාග ප්‍රතිඵල :-

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ප්‍රතිඵල දැන්වීම www.psc.wp.gov.lk වෙබ් අඩවිය මඟින් නිකුත් කරනු ඇත.

**13. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :-**

ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු - මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම හා කායික යෝග්‍යතාවය පරීක්ෂා කිරීම සඳහා පවත්වනු ලැබේ. ලකුණු ලබා දෙනු නොලැබේ.

**පත්කිරීම් බලධරයා - බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

**14.** විභාග ගාස්තු :-

සෑම අයදුම්කරුවෙකුම විභාග ගාස්තුවක් බස්නාහිර පළාත් සභාවට ගෙවිය යුතුය. විභාගය සඳහා විභාග ගාස්තුව රුපියල් 1,200කි. මෙම විභාග ගාස්තුව බස්නාහිර පළාත් සභා ආදායම් ශීර්ෂ **20-03-02-99** ට බැරවන ලෙස අයදුම්පත්‍ර භාරගනු ලබන අවසාන දිනට හෝ ඊට ප්‍රථම බස්නාහිර පළාත තුළ පිහිටා ඇති ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදලින් ගෙවා ඔබගේ නමින් ලබා ගන්නා (බ.ප. 1) ලදුපත අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ අලවා තිබිය යුතුය. එහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. මෙම විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව කුමන කරුණක් නිසාවත් සම්පූර්ණයෙන්ම හෝ අර්ධ වශයෙන් හෝ ආපසු ගෙවනු නොලැබේ. තවද විභාග ගාස්තුව සඳහා මුද්දර හෝ මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.

**15.** අයදුම්කළ යුතු පිළිවෙල:-

I. සියලුම අයදුම්කරුවන් www.psc.wp.gov.lk යන බස්නාහිර පළාත් අපගේ නිල වෙබ් අඩවියට පිවිස මෙම විභාග නිවේදනය අනුව නිල වෙබ් අඩවියට උඩුගත (Upload) කර ඇති අයදුම්පත බාගත කිරීම සිදුකළ හැකිය.

II. අසම්පූර්ණ ලෙස තොරතුරු යොමු කර ඇති අයදුම්පත්, මූලික සුදුසුකම් සපුරා නොමැති අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරේ. සම්පූර්ණ කර එවනු ලබන අයදුම්පතෙහි ජායා පිටපතක් අයදුම්කරු සතුව තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.

III. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :-

අයදුම්පතේ අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවෙකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා සහතික කරවා ගත යුතු අතර අයදුම්පත ආයතන ප්‍රධානියා මඟින් යොමු කළ යුතුය. එසේ නොවන අයදුම්කරුවෙකු තම අත්සන රජයේ පාසලක විදුහල්පතිවරයෙකු, කොට්ඨාශයේ ග්‍රාම නිලධාරිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියෙකු, රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍යාගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයෙකු ලවා සහතික කරනු ලැබ තිබිය යුතුය.

IV. මාර්ගගත ක්‍රමය ඔස්සේ අයදුම්පත් යොමු කළ හැකි අවසාන දිනය - **2026.05.10**

V. අපගේ නිල වෙබ් අඩවියට පිවිස මාර්ගගත ක්‍රමය මඟින් **2026.05.10** දිනට ප්‍රථම අයදුම්පත් යොමු කිරීම සිදු කළ යුතු අතර, නිවැරදිව සම්පූර්ණ කර බාගත කර ගන්නා ලද අයදුම්පත් අයදුම්කරුගේ අත්සන සහිතව හා අත්සන සහතික කර ගැනීමෙන් අනතුරුව **2026.05.15** දිනට හෝ ඊට පෙර ලැබෙන සේ පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. මෙදිනට පසුව ලැබෙන අයදුම්පත් භාර ගනු නොලැබේ.

ලේකම්,
බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
(බඳවා ගැනීම් අංශය),
අංක 628, 10 මහල,
ජනජය සිටි ගොඩනැඟිල්ල,
නාවල පාර, රාජගිරිය.

- අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරී (සිවිල්) III ශ්‍රේණිය, පුහුණු ශ්‍රේණිය (එක් වසරක පුහුණු කාලය), පුහුණු ශ්‍රේණිය (දෙවසරක පුහුණු කාලය) සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026"** යන්න අනිවාර්යයෙන්ම සඳහන් කළ යුතුය.

VI. අයදුම්පතක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේ දී නැතිවූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ. අවසාන දිනය දක්වා අයදුම්පත් ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි හානිය අයදුම්කරුවන් විසින් විඳදරා ගත යුතුය. එමෙන්ම අයදුම්පත් ලැබුණු බව දන්වනු නොලැබේ.

VII. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් කිසිඳු අයුරකින් සලකා බලනු නොලැබේ.

VIII. මෙම නිවේදනයෙන් ආවරණය නොවන කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳව තීරණය කිරීමේ අයිතිය ද කිසියම් පුරප්පාඩුවලින් කොටසක් හෝ මුළුමනින්ම පිරවීම හෝ නොපිරවීම හෝ පිළිබඳව අවසන් තීරණය ගැනීමේ අයිතිය බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ. එසේම මෙම බඳවාගැනීම කල් දැමීම, අවලංගු කිරීම හෝ පැවැත්වීමෙන් පසු තෝරා ගැනීම/ නොගැනීම පිළිබඳව අවසන් තීරණය බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

IX. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත පරිදි අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් පමණක් ලිඛිත පරීක්ෂණයන් සඳහා කැඳවනු ඇත. මේ සඳහා අයදුම් කරනු ලබන සියලුම අයදුම්කරුවන් සුදුසුකම් සම්පූර්ණ කර ඇතැයි උපකල්පනය කර ලිඛිත පරීක්ෂණය සඳහා සහභාගී වීමට අවස්ථාව දෙනු ලැබේ. ලිඛිත පරීක්ෂණය සඳහා සහභාගී වීමට අවස්ථාව ලබා දීම, සුදුසුකම් සම්පූර්ණ කර ඇති බවට පිළිගැනීමක් වශයෙන් නොසැලකිය යුතු ය. එසේ වුව ද අයදුම්කරු සුදුසුකම් සම්පූර්ණ කර නොමැති බව අනාවරණය වන ඕනෑම අවස්ථාවක දී අපේක්ෂකත්වය අවලංගු කිරීමට හා පත්වීම ලබා දීම ප්‍රතික්ෂේප කිරීමේ බලය බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

**16. විභාගයට ඇතුලත් කර ගැනීම :-**

*(අ)* විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් විසින් තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය පළමුවෙන්ම එම ශාලාවේ පෙනී සිටින විභාග දිනයේදී එහි විභාග මධ්‍යස්ථාන භාර ශාලාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එවැනි ප්‍රවේශ පත්‍රයක් ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ.

*(ආ)* අපේක්ෂකයෙකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදී ම විභාගයට පෙනී සිටිය යුතුය.

*සටහන :- අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීම සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.*

**17. අපේක්ෂකයින්ගේ අනන්‍යතාව :-**

ප්‍රවේශ පත්‍රයක් නොමැති කිසිදු අයදුම්කරුවෙකුට විභාගයට පෙනී සිටීමට අවස්ථාව නොලැබේ. තවද, අයදුම්කරුවන් විභාග ශාලාව තුළ දී පෙනී සිටින සෑම ප්‍රශ්න පත්‍රයක් සඳහා ම විභාග ශාලාධිපති සෑහීමට පත් වන පරිදි ස්වකීය අනන්‍යතාවය ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් ලියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

(i) ජාතික හැඳුනුම්පත
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය
(iii) වලංගු රියදුරු බලපත්‍රය

විභාග අපේක්ෂකයින්ගේ අනන්‍යතාව තහවුරු කර ගත හැකිවන පරිදි මුහුණ හා ඉලෙක්ට්‍රෝනික සන්නිවේදන උපාංග පැළඳ ගෙන නොමැති බව සනාථ කිරීම සඳහා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තවද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

**18. සාවද්‍ය තොරතුරු සැපයීම :-**

මෙම විභාගයට ඉදිරිපත්වීම සඳහා කිසියම් අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ හෝ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. තවද, කිසියම් අපේක්ෂකයෙකු විසින් ඉදිරිපත් කරන ලද යම් තොරතුරක් සාදවා බව දැන දැනම ඉදිරිපත් කළ බව පෙනී ගියහොත් ඔහු හෝ ඇය සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කරනු ලැබේ.

i. අයදුම්පත පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයට අදාළ රෙගුලාසි අනුව කිසියම් අපේක්ෂකයෙකු ඊට පෙනී සිටීමට නුසුදුසු වෙතැයි පෙනී යන ලද නම්, විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ ඊට පසු හෝ යන කවර අවස්ථාවක දී වුව ද ඔහුගේ/ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය.

ii. අපේක්ෂකයෙකු විසින් සපයන ලද තොරතුරු පසු කලක දී වැරදි බව පෙනී ගියහොත් හෝ ඔහු/ ඇය විසින් හිතාමතාම කිසියම් කරුණක් වසන් කරන ලද බව හෙළිවුවහොත් හෝ ඔහුට/ ඇයට පත්වීමක් ලබාදීම සම්බන්ධයෙන් තවදුරටත් සලකා බලනු නොලබන අතර, මෙම විභාගය හේතු කොට ගෙන දී තිබූ පත්වීමක් අහෝසි කිරීමට හෝ රජයේ සේවයෙන් පහ කිරීමට වුව ද යටත් වේ.

19. විභාගය පැවැත්වීම සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන ඕනෑම දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

20. විභාගය පැවැත්වීම, විභාගය අවලංගු කිරීම හෝ විභාගයේ ප්‍රතිඵල අත්හිටුවීම සහ ඊට අනුෂාංගිකව විභාග නිවේදනයේ විධිවිධාන සලසා නොමැති වෙනත් කවර හෝ කරුණක් සම්බන්ධයෙන් බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වන්නේය. සියලුම අයදුම්කරුවන් මෙම නිවේදනයේ සඳහන් නීති රීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

21. මෙම නිවේදනයේ සඳහන් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි.

තිලක් සෙනරත්,
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

2026 මාර්තු මස 27 දින,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.),
අංක: 628, 10 මහල,
ජන ජය සිටි ගොඩනැගිල්ල,
නාවල පාර, රාජගිරිය.

(මෙම දැන්වීම පදනම් කරගෙන විවිධ ආයතන විසින් සාවද්‍ය ලෙස සකස් කර ඉදිරිපත් කරනු ලබන දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව කිසිදු වගකීමක් දරනු නොලැබේ.)

## ආදර්ශ අයදුම්පත්‍රය

**බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ (සිවිල්) III, පුහුණු ශ්‍රේණිය (එක් වසරක පුහුණු කාලය) සහ පුහුණු ශ්‍රේණිය (දෙවසරක පුහුණු කාලය) සඳහා බඳවා ගැනීමේ (විවෘත) තරග විභාගය - 2026**

විභාග අංකය : [ ]
(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

- නිවේදනයේ අංක 01 අනුව ඉල්ලුම්කරන තනතුරට අදාළ ශ්‍රේණිය (අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

III ශ්‍රේණිය - I
පුහුණු ශ්‍රේණිය (එක් වසරක) - II [ ] (මෙම ශ්‍රේණිය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.)
පුහුණු ශ්‍රේණිය (දෙවසරක) - III

- ආබාධිත බව : [ ] (ආබාධිත අපේක්ෂකයෙකු නම් කොටුව තුළ √ ලකුණ යොදන්න.)

- විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය (අදාළ අක්ෂරය කොටුව තුළ ලියන්න.)

සිංහල - S
දෙමළ - T [ ] (අදාළ මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.)
ඉංග්‍රීසි - E

**01** 1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) - [ ]

(උදා : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

1.2 මුලකුරු සමග අගට යෙදෙන නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) : [ ]

(උදා: H.M.S.K. GUNAWARDHANA)

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) : [ ]

1.4 ජාතික හැඳුනුම්පත් අංකය : [ ]

**02** 2.1 ස්ත්‍රී/පුරුෂ භාවය : [ ]

**03** 3.1 විවාහක/අවිවාහක බව : [ ]

3.2 උපන් දිනය - වර්ෂය : [ ] මාසය : [ ] දිනය : [ ]

3.3 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන **2026.05.10** දිනට වයස :

අවුරුදු : [ ] මාස : [ ] දින : [ ]

**04** 4.1 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) : [ ]

ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) : [ ]

4.2 විභාග ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :

i. සිංහලෙන්/දෙමළෙන් : [ ]

ii. ඉංග්‍රීසි කැපිටල් අකුරින් : [ ]

4.3 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය : [ ]

4.4 බස්නාහිර පළාතේ ස්ථිරව පදිංචිව සිටින කාල සීමාව : [ ]

4.5 විද්‍යුත් තැපැල් ලිපිනය : [ ]

4.6 දුරකථන අංකය :

ස්ථාවර : | | | | | | | | | | | ජංගම : | | | | | | | | | | |

❖ විභාගය සම්බන්ධ සියළු තොරතුරු ඉහත සඳහන් කරනු ලබන ජංගම දුරකථන අංකයට SMS ක්‍රමය මගින් යවනු ලබන බැවින් වලංගු දුරකථන අංකයක් සඳහන් කරන්න. SMS පණිවිඩ නොලැබීම සම්බන්ධයෙන් පසුව කරනු ලබන පැමිණිලි සලකනු නොලැබේ.

**05.** **අධ්‍යාපන සුදුසුකම් -**

**5.1** අධ්‍යයන පොදු සහතික පත්‍ර **(සා.පෙළ)** පිළිබඳ විස්තරය:

| | | |
|---|---|---|
| i. විභාගයේ වර්ෂය හා මාසය: | පළමු අවස්ථාව | |
| | | |
| ii. විභාග අංකය | | |
| iii. ප්‍රතිඵල | විෂයය | සාමාර්ථය |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |

5.2 අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ.පෙළ) පිළිබඳ විස්තරය:

| | | |
|---|---|---|
| i. විභාගයේ වර්ෂය හා මාසය: | | |
| ii. විභාග අංකය | | |
| iii. ප්‍රතිඵල | විෂයය | සාමාර්ථය |
| | | |
| | | |
| | | |
| | | |

5.3 අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ අංක 10 ප්‍රකාරව මෙම විභාගයට පෙනී සිටීම සඳහා ඔබ ලබා ඇති වෘත්තීය සුදුසුකම් සම්බන්ධ පාඨමාලාව/ සුදුසුකම් පිළිබඳ විස්තර:

| | |
|---|---|
| I. විශ්ව විද්‍යාලය/ ආයතනය : | |
| II. පාඨමාලාවේ නම : | |
| III. කාල සීමාව : | |
| IV. පාඨමාලාව සම්පූර්ණ කළ දිනය : | |
| V. වෙනත් සුදුසුකම් : | |

**(ඉහතින් දක්වා ඇති සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාළ සහතික/ ලේඛන අමුණන්න)**

**06.** ඔබ කවරදාක හෝ කවර චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද? [ ]

**6.1** ඉහත පිළිතුර"ඔව්"නම් ඒ පිළිබඳ විස්තර සඳහන් කරන්න: ..........................................................................

..........................................................................................................................................

**07.** විභාග ගාස්තු ගෙවූ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :- ..........................................................................

ලදුපත් අංකය :- ......................................................................

දිනය :- ......................................................

. මෙහි ලදුපත උඩුගත (UPLOAD) කරන්න

| | |
|---|---|
| ලදුපත මෙම කොටුව තුළ නොගැලවෙන සේ අලවන්න. | **ලදුපත UPLOAD කිරීමට හැකිවන සේ සකසන්න.** |

(ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදල් ගෙවා ලබාගන්නා ලද බ.ප. 1 ලදුපත පමණක් වලංගු වේ.)

**08.** <u>අයදුම්කරුගේ සහතිකය</u>

..........................................................................................................................................
........................................................................ වන මා විසින් මෙම අයදුම්පතේ සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මා විසින් සපයා ඇති තොරතුරු සාවද්‍ය යැයි සොයාගනු ලැබුවහොත් බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්‍ෂණ සේවයේ තාක්‍ෂණ නිලධාරී (සිවිල්) III ශ්‍රේණියේ/ පුහුණු ශ්‍රේණිය (එක් වසරක)/ පුහුණු ශ්‍රේණිය (දෙවසරක) තනතුරට පත්කිරීම සඳහා වූ මාගේ හිමිකම නොසලකා හරිනු ලැබීමටද මට විරුද්ධව විනයානුකූලව කටයුතු කරනු ලැබීමටද හැකි බව මම හොඳාකාරව දනිමි. තවද සම්මුඛ පරීක්‍ෂණය පැවැත්වීම සම්බන්ධයෙන් පනවනු ලබන නීති රීතිවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

දිනය : ......................... ................................,
අයදුම්කරුගේ අත්සන.

**09.** <u>අයදුම්කරුගේ අත්සන සහතික කිරීම</u>

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ..................................................................... මයා/ මිය/ මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු ඇය නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්, එම ලදුපත අයදුම්පතෙහි අලවා ඇති බවත් , ඔහු/ ඇය ..................................වැනි දින මා ඉදිරිපිට දී ඔහු/ඇය ගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

.................................................,
අත්සන සහතික කරන නිලධාරිගේ
අත්සන හා නිල මුද්‍රාව.

දිනය :................................................
සහතික කරන නිලධාරියාගේ නම :................................................
තනතුර :...............................................
ලිපිනය :................................................

10. **<u>රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය:</u>** (අදාළ වන්නේනම් පමණක් සඳහන් කරන්න.)

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ...................................................................................... මයා/මිය/මෙනවිය දැනට ........... ............................................. කාර්යාලයේ/ආයතනයේ ................................. දින සිට මේ දක්වා ........................... ......................... (තනතුර) වශයෙන් ස්ථිර/තාවකාලික/අනියම් (අනවශ්‍ය වචන කපා හරින්න) තනතුරක සේවය කරන බවද,

ඔහුගේ/ඇයගේ සේවය සතුටුදායක බවද, මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා ඇය/ඔහු තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරින් නිදහස් කරන බව ද/නොකරන බව ද, ඉහත සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බව ද සහතික කරමි.

.................................................,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ
අත්සන හා නිල මුද්‍රාව.

දිනය :.................................................
සහතික කරන නිලධාරියාගේ නම :.................................................
තනතුර :...............................................
ලිපිනය :.................................................

04-32/1

---

**බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරී (විදුලි) III ශ්‍රේණිය, පුහුණු ශ්‍රේණිය (එක් වසරක පුහුණු කාලය) සහ පුහුණු ශ්‍රේණිය (දෙවසරක පුහුණු කාලය) සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026

01. බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ පහත තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා බස්නාහිර පළාතේ වසර තුනක (03) අඛණ්ඩ ස්ථිර පදිංචිය ඇති පහත සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම බඳවා ගැනීමේ විවෘත තරග විභාගය, බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් ඉදිරි යෝජිත දිනයක දී පැවැත්වීමට නියමිතය. විභාගය පවත්වන දිනය පසුව දැනුම් දෙනු ලැබේ.

I. බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරී (විදුලි) III ශ්‍රේණිය
II. බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරී (විදුලි) (එක් වසරක පුහුණු කාලය)
III. බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරී (විදුලි) (දෙවසරක පුහුණු කාලය)

**02. පොදු සුදුසුකම් :-**

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

II. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

III. යම් ආගමක නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තෙකු මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.

IV. අයදුම්පත් කැඳවන අවසාන දිනට පූර්වාසන්න වසර තුනක් (03) තුළ බස්නාහිර පළාතේ අඛණ්ඩ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.

V. සේවයට බඳවා ගැනීම සඳහා වන තරග විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු අදාළ සියලු සුදුසුකම් හා නියමිත වයස් සීමාව අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

VI. අයදුම්කරු බස්නාහිර පළාත තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

**03. වයස් සීමාව :-**

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට එනම් **2026.05.10** දිනට වයස අවුරුදු **18** ට නොඅඩු හා අවුරුදු **30** ට නොවැඩි විය යුතුය.

**04. සේවා කොන්දේසි :-**

*(අ)* මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. තව ද ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය මඟින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

*(ආ)* රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, 2019.08.15 දිනැතිව බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරී (විදුලි) තනතුරට බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියේ පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද, එම බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියේ කර ඇති හෝ මින්මතු කෙරෙන සංශෝධනවලට ද, ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි විධිවිධානවලට ද, අංක 2364/32 සහ 2023.12.29 වැනි දින දරන *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලට ද යටත් විය යුතු වේ.

*(ඇ)* මෙම පත්වීම අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වේ. තාක්ෂණ නිලධාරී (විදුලි) III ශ්‍රේණියේ තනතුරකට බඳවා ගෙන වසර තුන (03) ක් ඇතුළත බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියේ සඳහන් පරිදි පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

*(ඇ)* 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 හා එයට වරින් වර සිදුකරන සංශෝධනයන්ට අනුව නියම කර ඇති පරිදි දෙවන රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාවය ලබා ගත යුතුය.

**05. පුරප්පාඩු ප්‍රමාණය :- 20**

**06. පවත්නා පුරප්පාඩු ක්ෂේත්‍රයන් :-**

ඉහත සඳහන් තනතුරුවල පුරප්පාඩු සඳහා බඳවා ගැනීම සම්බන්ධයෙන් අවසාන තීරණය බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

**6.1** අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනය **2026.05.10** දින වේ. අයදුම් කරන තනතුරට අදාළ සියලු සුදුසුකම් **2026.05.10** දින හෝ එදිනට පෙර සම්පූර්ණ කර තිබිය යුතුයි.

**07. බඳවා ගැනීමේ ක්‍රමය :**

- ලිඛිත තරඟ විභාගයක සහ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙළ අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුස්සන් තෝරනු ලැබේ.

- ලිඛිත තරඟ විභාගයේ ප්‍රතිඵල අනුව සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා වන සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවන අයදුම්කරුවන් නියමිත දිනයේ දී සහභාගී නොවීම සම්බන්ධයෙන් කිසිදු අයුරකින් නැවත සලකා බලනු නොලැබේ. එමෙන්ම සම්මුඛ පරීක්ෂණ දිනට සියලු සහතික ඉදිරිපත් කළ යුතු අතර, එදිනට පසුව ඉදිරිපත් කරනු ලබන කිසිදු සහතික භාර ගනු නොලැබේ.

- පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය පත්වීම් බලධරයා විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීමට පත්වීම් බලධරයාට බලය ඇත. කිසියම් අවස්ථාවක පුරප්පාඩු සම්පූර්ණ කරන කඩඉම් ලකුණේ සම ලකුණු ලබා ගත් අයදුම්කරුවන් කිහිප දෙනෙක් සිටින අවස්ථාවක එම පුරප්පාඩු සංඛ්‍යාව පිරවීම සඳහා කඩඉම් ලකුණේ සම ලකුණු ලබා ගත් අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයකට ලක් කර එහි කුසලතාව මත එම පුරප්පාඩු ප්‍රමාණය සම්පූර්ණ කරනු ලැබේ.

- සීමිත තරඟ විභාගයෙන් බඳවා ගැනීමට නියමිත ප්‍රතිශතය සඳහා ප්‍රමාණවත් මූලික සුදුසුකම් සහිත අභ්‍යන්තර අයදුම්කරුවන් අදාළ දෙපාර්තමේන්තුව/ අමාත්‍යාංශය තුළ නොසිටී නම් පමණක් ඉතිරි ප්‍රමාණය විවෘත තරඟ විභාගය මඟින්ම තෝරා ගන්නා බාහිර අයදුම්කරුවන්ගෙන්ම සම්පූර්ණ කර ගනු ලැබේ.

- පුහුණු කාලසීමාව අවසානයේ දී III ශ්‍රේණියට බඳවා ගැනීම.

(අ) විවෘත ධාරාව හෝ සීමිත ධාරාව හෝ යටතේ පුහුණු කිරීමේ ශ්‍රේණියට ඇතුළත් කරගනු ලබන අයදුම්කරුවන් අදාළ බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් පුහුණු කාලසීමාව සාර්ථක ලෙස සම්පූර්ණ කිරීමෙන් අනතුරුව බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන විභාගය සමත් වීමෙන් පසු සේවයේ III ශ්‍රේණියට බඳවා ගනු ලැබේ.

(ආ) පුහුණුව අවසානයේ පවත්වනු ලබන විභාගය සමත් වීමට අපොහොසත් වන ආධුනිකයින් වෙතොත් ඔවුනට මාස 06 කට නොවැඩි කාලයක් සඳහා සිය පුහුණු කාලය දීර්ඝ කරවා ගැනීමට අවස්ථාව ඇත. එසේ දීර්ඝ කරනු ලබන කාල සීමාව අවසානයේ නැවත පවත්වනු ලබන විභාගය අසමත් වන විවෘත ධාරාව යටතේ අයදුම්කළ ආධුනිකයන්ගේ සේවය අවසන් කරනු ලැබේ.

08. මාසික වැටුප් පරිමාණය :-

- III ශ්‍රේණිය MN 03 – 2025
  රු. 52,250 - 10 X 800 - 11X 1,190- 10 X 1,320 -10X1,350 - රු. 100,040/-
  (රා.පරි.ච. 10/2025 හි උපලේඛන III අනුව ගෙවනු ලැබේ.)

- පුහුණු ශ්‍රේණිය (එක් වසරක පුහුණු කාලය) - 2026.01.01 දිනට වන මාසික දීමනාව රු. 43,274/-

- පුහුණු ශ්‍රේණිය (දෙවසරක පුහුණු කාලය) - 2026.01.01 දිනට මාසික දීමනාව රු. 43,730/-
  (මාසික දීමනා රා.පරි.ච.10/2025 හි උපලේඛන VI අනුව ගෙවනු ලැබේ.)

**09. මූලික සුදුසුකම් :-**

| *තනතුර* | *සුදුසුකම්* |
|---|---|
| **බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ (විදුලි)**<br>➢ III ශ්‍රේණිය | **(අ) අධ්‍යාපන සුදුසුකම් :**<br><br>අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී විද්‍යා/ගණිත විෂය ධාරාව යටතේ රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, සංයුක්ත ගණිතය යන විෂයයන් අතුරින් විෂයයන් දෙකක් සහිතව විෂයයන් තුනකින් එකවර සමත්ව තිබීම හෝ තාක්ෂණවේදය විෂය ධාරාව යටතේ ඉංජිනේරු තාක්ෂණවේදය, තාක්ෂණවේදය සඳහා විද්‍යාව, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යන විෂයයන් අතුරින් විෂයයන් දෙකක් සහිතව විෂයයන් තුනකින් එකවර සමත්වීම ;<br><br>*සහ*<br><br>සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගය සමත්ව තිබීම.<br><br>**(ආ) වෘත්තීය සුදුසුකම් :**<br><br>1. මොරටුව විශ්වවිද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික (විදුලි) ඩිප්ලෝමාව ;<br><br>*හෝ*<br><br>2. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව (විදුලි) ;<br><br>*හෝ* |

| *තනතුර* | *සුදුසුකම්* |
|---|---|
| **බස්නාහිර පළාත් සහා රාජ්‍ය සේවයේ තාක්‍ෂණ සේවයේ (විදුලි)**<br>➢ III ශ්‍රේණිය | 3. අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව (විදුලි) ;<br>*හෝ*<br>4. ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්‍ෂණික ඩිප්ලෝමාව (විදුලි) ;<br>*හෝ*<br>5. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ පළමු වන කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම ;<br>*හෝ*<br>6. රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 06 වන මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම ;<br>7. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්‍ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්‍ෂණික සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්‍ෂණික සුදුසුකම් ලබා තිබීම. |
| ➢ පුහුණු ශ්‍රේණිය (එක් වසරක පුහුණු කාලය) | **(අ) අධ්‍යාපන සුදුසුකම්**<br>අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී විද්‍යා/ගණිත විෂය ධාරාව යටතේ රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සංයුක්ත ගණිතය යන විෂයයන් අතුරින් විෂයයන් දෙකක් සහිතව විෂයයන් තුනකින් එකවර සමත්ව තිබීම හෝ තාක්‍ෂණවේදය විෂය ධාරාව යටතේ ඉංජිනේරු තාක්‍ෂණවේදය, තාක්‍ෂණවේදය සඳහා විද්‍යාව, තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණය යන විෂයයන් අතුරින් විෂයයන් දෙකක් සහිතව විෂයයන් තුනකින් එකවර සමත්වීම ;<br>*සහ*<br>සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගය සමත්ව තිබීම ;<br>**(ආ) වෘත්තීය සුදුසුකම්**<br>01. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක විදුලි ක්ෂේත්‍රයේ වසර 03 ක පාඨමාලාවක් සාර්ථකව හදාරා ජාතික තාක්‍ෂණ සහතිකය (විදුලි) ලබා තිබීම ;<br>*හෝ*<br>02. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක විදුලි ක්ෂේත්‍රයේ කර්මාන්ත තාක්‍ෂණිකයන් සඳහා වූ වසර 02 ක ජාතික සහතික පත්‍ර පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර අදාළ සහතිකය ලබා තිබීම ;<br>*හෝ* |

| තනතුර | සුදුසුකම් |
|---|---|
| ➢ පුහුණු ශ්‍රේණිය (එක් වසරක පුහුණු කාලය) | 03. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්‍ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්‍ෂණික සුදුසුකම්වලට සියළු අතින් සමාන යැයි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්‍ෂණික සුදුසුකම් ලබා තිබීම. |
| ➢ පුහුණු ශ්‍රේණිය (දෙවසරක පුහුණු කාලය) | **(අ) අධ්‍යාපන සුදුසුකම් :**<br><br>අ.පො.ස. (උ.පෙළ) විභාගයේදී විද්‍යා/ගණිත විෂය ධාරාව යටතේ රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, සංයුක්ත ගණිතය යන විෂයන් අතුරින් විෂයන් දෙකක් සහිතව විෂයයන් තුනකින් එකවර සමත්ව තිබීම හෝ තාක්‍ෂණවේදය විෂය ධාරාව යටතේ ඉංජිනේරු තාක්‍ෂණවේදය, තාක්‍ෂණවේදය සඳහා විද්‍යාව, තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණය යන විෂයයන් අතුරින් විෂයයන් දෙකක් සහිතව විෂයයන් තුනකින් එකවර සමත්වීම ;<br><br>*සහ*<br><br>සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගය සමත්ව තිබීම. |

**සටහන :**

i) III ශ්‍රේණියට සෘජුව බඳවා ගැනීම සහ පුහුණු ශ්‍රේණියට බඳවා ගැනීම යන ක්‍රම දෙකින්ම බඳවා ගන්නා විට බඳවා ගැනීමේ ශ්‍රේණිය වන III ශ්‍රේණියට පළමුව බඳවා ගනු ලැබේ.

ii) III ශ්‍රේණියට සුදුසුකම් ලබන අයදුම්කරුවන් සංඛ්‍යාව පුරප්පාඩු සංඛ්‍යාවට ප්‍රමාණවත් නොවන විට, ඉතිරි පුරප්පාඩු සඳහා පුහුණු ශ්‍රේණියට අදාළ සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් පුහුණු කිරීමේ ශ්‍රේණියට ඇතුළත් කර ගනු ලැබේ.

iii) පුහුණු ශ්‍රේණිය එක් වසරක පුහුණු කාලය හා දෙවසරක පුහුණු කාලය අවසානයේ පවත්වනු ලබන ලිඛිත පරීක්‍ෂණයේ ලකුණු පදනම් කර ගනිමින් III ශ්‍රේණියට පත්කිරීමේ දී ජ්‍යෙෂ්ඨත්වය තීරණය කරනු ලබයි.

**10. ලිඛිත තරඟ විභාගය පිළිබඳ විස්තර :**

❖ **පුහුණු කිරීමේ ශ්‍රේණිය (එක් වසරක පුහුණුව සඳහා) සහ III ශ්‍රේණිය සඳහා**

| *විෂයය සහ විෂය නිර්දේශය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| **බුද්ධි පරීක්‍ෂණය :**<br><br>අපේක්‍ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාවයත්, ඔහුගේ සිතීමේ විශ්ලේෂණ තත්වයන් තීරණය කිරීමේ ශක්තියත්, විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් යුක්තය. | පැය 01 | 100 | 40% |
| **විෂයානුබද්ධ තාක්‍ෂණික පරීක්‍ෂණය**<br><br>*ප්‍රතිරෝධ *ධාරිත්‍රක *ඩයෝඩ අදාළ මූලධර්ම - ස්ථිති විද්‍යුතය, විද්‍යුත් චුම්බකත්වය, විද්‍යුත් චුම්බක ක්ෂේත්‍රවල මූලික සංකල්ප සංවර්ධනය, සන්නායකවල සරල පද්ධති ධාරිතා බලය සහ ස්වීය අන්‍යොන්‍ය ප්‍රේරණ, සංගුණකය, විද්‍යුත් චුම්බක ආකෘතියේ ප්‍රේරිත විද්‍යුත් ගාමක බලය, තනිකලා පරිනාමකයන්ගේ මූලික ප්‍රතිපත්ති සමඟ පරිපථ හා දෛශික රූප සටහන්, සරල ධාරා ශ්‍රේණි, උපපථ හා සංයුක්ත ජනකය සහ මෝටර් යන්ත්‍ර පිළිබඳ මූලික ක්‍රියාකාරී ලක්‍ෂණ, ආමේචර් ප්‍රතික්‍රියාව හා කාන්දු ප්‍රතිබාධකය, මෝටර් යන්ත්‍ර සැර දැමීමේ මූල ධර්ම, සමාන්තර ක්‍රියාකාරී පරිවර්ථන හා ජනක ප්‍රත්‍යාවර්ථන සමකාලීන කිරීම. | පැය 03 | 100 | 40% |

| විෂයය සහ විෂය නිර්දේශය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු ප්‍රමාණය |
| --- | --- | --- | --- |
| * විදුලිය රැහැන් ඇදීම (තනිකලා හා තෙකලා)<br>* විදුලිය පද්ධතියක ආරක්ෂණ ක්‍රම<br>* ක්ෂමතාවය හා ජවසාධකය දියුණු කිරීම යන විෂයන්ගෙන් සමන්විත ප්‍රශ්නාවලියකින් යුක්තය. | පැය 03 | 100 | 40% |

❖ **පුහුණු කිරීමේ ශ්‍රේණිය (දෙවසරක පුහුණුව සඳහා)**

| විෂයය සහ විෂය නිර්දේශය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු ප්‍රමාණය |
| --- | --- | --- | --- |
| **බුද්ධි පරීක්ෂණය**<br>අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාවයත්, ඔහුගේ සිතීමේ විශ්ලේෂණ තත්වයන් තීරණය කිරීමේ ශක්තියත්, විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් යුක්තය. | පැය 02 | 100 | 40% |

**11.** විභාග ප්‍රතිඵල :-

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ප්‍රතිඵල දැන්වීම www.psc.wp.gov.lk වෙබ් අඩවිය මගින් නිකුත් කරනු ඇත.

**12. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :-**

ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු - මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම හා කායික යෝග්‍යතාවය පරීක්ෂා කිරීම සඳහා පවත්වනු ලැබේ. ලකුණු ලබා දෙනු නොලැබේ.

**පත්කිරීම් බලධරයා - බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

**13.** විභාග ගාස්තු **:-**

සෑම අයදුම්කරුවෙකුම රු. 1,200.00 ක විභාග ගාස්තුවක් බස්නාහිර පළාත් සභාවට ගෙවිය යුතුය. මෙම විභාග ගාස්තුව බස්නාහිර පළාත් සභා ආදායම් ශීර්ෂ **20-03-02-99** ට බැර වන ලෙස අයදුම්පත්‍ර භාරගනු ලබන අවසාන දිනට හෝ ඊට ප්‍රථම බස්නාහිර පළාත තුළ පිහිටා ඇති ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදලින් ගෙවා ඔබගේ නමින් ලබා ගන්නා (බ.ප. 1) ලදුපත අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ අලවා තිබිය යුතුය. එහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. මෙම විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව කුමන කරුණක් නිසාවත් සම්පූර්ණයෙන්ම හෝ අර්ධ වශයෙන් හෝ ආපසු ගෙවනු නොලැබේ. තවද විභාග ගාස්තුව සඳහා මුද්දර හෝ මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.

**14. අයදුම් කළ යුතු පිළිවෙල:-**

I. සියලුම අයදුම්කරුවන් www.psc.wp.gov.lk යන බස්නාහිර පළාත් අපගේ නිල වෙබ් අඩවියට පිවිස මෙම විභාග නිවේදනය අනුව නිල වෙබ් අඩවියට උඩුගත (Upload) කර ඇති අයදුම්පත බාගත කිරීම සිදුකළ හැකිය.

II. අසම්පූර්ණ ලෙස තොරතුරු යොමු කර ඇති අයදුම්පත්, මූලික සුදුසුකම් සපුරා නොමැති අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරේ. සම්පූර්ණ කර එවනු ලබන අයදුම්පතෙහි ඡායා පිටපතක් අයදුම්කරු සතුව තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.

III. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :-

අයදුම්පතේ අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවෙකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා සහතික කරවා ගත යුතු අතර අයදුම්පත ආයතන ප්‍රධානියා මඟින් යොමු කළ යුතුය. එසේ නොවන අයදුම්කරුවෙකු තම අත්සන රජයේ පාසලක විදුහල්පතිවරයෙකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියෙකු, රජයේ හෝ පළාත්

රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍යආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයෙකු ලවා සහතික කරනු ලැබ තිබිය යුතුය.

IV. මාර්ගගත ක්‍රමය ඔස්සේ අයදුම්පත් යොමු කළ හැකි අවසාන දිනය - **2026.05.10**

V. අපගේ නිල වෙබ් අඩවියට පිවිස මාර්ගගත ක්‍රමය මගින් **2026.05.10** දිනට ප්‍රථම අයදුම්පත් යොමු කිරීම සිදු කළ යුතු අතර, නිවැරදිව සම්පූර්ණ කර බාගත කර ගන්නා ලද අයදුම්පත් අයදුම්කරුගේ අත්සන සහිතව හා අත්සන සහතික කර ගැනීමෙන් අනතුරුව **2026.05.15** වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. මෙදිනට පසුව ලැබෙන අයදුම්පත් භාර ගනු නොලැබේ.

ලේකම්,
බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
(බඳවා ගැනීම් අංශය),
අංක 628, 10 මහල,
ජනජය සිටි ගොඩනැගිල්ල,
නාවල පාර, රාජගිරිය.

- අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරී (විදුලි) III ශ්‍රේණිය, පුහුණු ශ්‍රේණිය (එක් වසරක පුහුණු කාලය), පුහුණු ශ්‍රේණිය (දෙවසරක පුහුණු කාලය) සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026"** යන්න අනිවාර්යයෙන්ම සඳහන් කළ යුතුය.

VI. අයදුම්පතක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේදී නැතිවූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ. අවසාන දිනය දක්වා අයදුම්පත් ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි හානිය අයදුම්කරුවන් විසින් විඳදරා ගත යුතුය. එමෙන්ම අයදුම්පත් ලැබුණු බව දන්වනු නොලැබේ.

VII. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් කිසිදු අයුරකින් සලකා බලනු නොලැබේ.

VIII. මෙම නිවේදනයෙන් ආවරණය නොවන කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳව තීරණය කිරීමේ අයිතිය ද කිසියම් පුරප්පාඩුවලින් කොටසක් හෝ මුළුමනින්ම පිරවීම හෝ නොපිරවීම හෝ පිළිබඳව අවසන් තීරණය ගැනීමේ අයිතිය බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ. එසේම මෙම බඳවාගැනීම කල් දැමීම, අවලංගු කිරීම හෝ පැවැත්වීමෙන් පසු තෝරා ගැනීම/නොගැනීම පිළිබඳව අවසන් තීරණය බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

IX. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත පරිදි අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් පමණක් ලිඛිත පරීක්ෂණයන් සඳහා කැඳවනු ඇත. මේ සඳහා අයදුම් කරනු ලබන සියලුම අයදුම්කරුවන් සුදුසුකම් සම්පූර්ණ කර ඇතැයි උපකල්පනය කර ලිඛිත පරීක්ෂණය සඳහා සහභාගී වීමට අවස්ථාව දෙනු ලැබේ. ලිඛිත පරීක්ෂණය සඳහා සහභාගී වීමට අවස්ථාව ලබා දීම, සුදුසුකම් සම්පූර්ණ කර ඇති බවට පිළිගැනීමක් වශයෙන් නොසැලකිය යුතු ය. එසේ වුව ද අයදුම්කරු සුදුසුකම් සම්පූර්ණ කර නොමැති බව අනාවරණය වන ඕනෑම අවස්ථාවක දී අපේක්ෂකත්වය අවලංගු කිරීමට හා පත්වීම ලබා දීම ප්‍රතික්ෂේප කිරීමේ බලය බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

**15. විභාගයට ඇතුළත් කර ගැනීම :-**

*(අ)* විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් විසින් තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය පළමුවෙන්ම එම ශාලාවේ පෙනී සිටින විභාග දිනයේදී එහි විභාග මධ්‍යස්ථාන භාර ශාලාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එවැනි ප්‍රවේශ පත්‍රයක් ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ.

*(ආ)* අපේක්ෂකයෙකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදී ම විභාගයට පෙනී සිටිය යුතුය.

*සටහන :- අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීම සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.*

**16. අපේක්ෂකයින්ගේ අනන්‍යතාව :-**

ප්‍රවේශ පත්‍රයක් නොමැති කිසිදු අයදුම්කරුවෙකුට විභාගයට පෙනී සිටීමට අවස්ථාව නොලැබේ. තවද, අයදුම්කරුවන් විභාග ශාලාව තුළ දී පෙනී සිටින සෑම ප්‍රශ්න පත්‍රයක් සඳහා ම විභාග ශාලාධිපති සෑහීමට පත් වන පරිදි ස්වකීය අනන්‍යතාවය ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් ලියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය :

(i) ජාතික හැඳුනුම්පත,
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය,
(iii) වලංගු රියදුරු බලපත්‍රය.

විභාග අපේක්ෂකයින්ගේ අනන්‍යතාව තහවුරු කර ගත හැකිවන පරිදි මුහුණ හා ඉලෙක්ට්‍රෝනික සන්නිවේදන උපාංග පැළඳ ගෙන නොමැති බව සනාථ කිරීම සඳහා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තවද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

**17. සාවද්‍ය තොරතුරු සැපයීම :-**

මෙම විභාගයට ඉදිරිපත්වීම සඳහා කිසියම් අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ හෝ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. තවද, කිසියම් අපේක්ෂකයෙකු විසින් ඉදිරිපත් කරන ලද යම් තොරතුරක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කළ බව පෙනී ගියහොත් ඔහු හෝ ඇය සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කරනු ලැබේ.

i. අයදුම්පත පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයට අදාළ රෙගුලාසි අනුව කිසියම් අපේක්ෂකයෙකු ඊට පෙනී සිටීමට නුසුදුසු වෙතැයි පෙනී යන ලද නම්, විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ ඊට පසු හෝ යන කවර අවස්ථාවක දී වුව ද ඔහුගේ/ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය.

ii. අපේක්ෂකයෙකු විසින් සපයන ලද තොරතුරු පසු කලක දී වැරදි බව පෙනී ගියහොත් හෝ ඔහු/ ඇය විසින් හිතාමතාම කිසියම් කරුණක් වසන් කරන ලද බව හෙළිවුවහොත් හෝ ඔහුට/ඇයට පත්වීමක් ලබා දීම සම්බන්ධයෙන් තවදුරටත් සලකා බලනු නොලබන අතර, මෙම විභාගය හේතුකොටගෙන දී තිබූ පත්වීමක් අහෝසි කිරීමට හෝ රජයේ සේවයෙන් පහ කිරීමට වුව ද යටත් වේ.

18. විභාගය පැවැත්වීම සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන ඕනෑම දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

19. විභාගය පැවැත්වීම, විභාගය අවලංගු කිරීම හෝ විභාගයේ ප්‍රතිඵල අත්හිටුවීම සහ ඊට අනුෂාංගිකව විභාග නිවේදනයේ විධිවිධාන සලසා නොමැති වෙනත් කවර හෝ කරුණක් සම්බන්ධයෙන් බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වන්නේය. සියලුම අයදුම්කරුවන් මෙම නිවේදනයේ සඳහන් නීති රීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

20. මෙම නිවේදනයේ සඳහන් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

තිලක් සෙනරත්,
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

2026 මාර්තු මස 27 දින,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.),
අංක 628, 10 මහල,
ජන ජය සිටි ගොඩනැගිල්ල,
නාවල පාර, රාජගිරිය.

(මෙම දැන්වීම පදනම් කරගෙන විවිධ ආයතන විසින් සාවද්‍ය ලෙස සකස් කර ඉදිරිපත් කරනු ලබන දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව කිසිදු වගකීමක් දරනු නොලැබේ.)

<u>ආදර්ශ අයදුම්පත්‍රය</u>

**බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ (විදුලි) III, පුහුණු ශ්‍රේණිය (එක් වසරක පුහුණු කාලය) සහ පුහුණු ශ්‍රේණිය (දෙවසරක පුහුණු කාලය) සඳහා බඳවා ගැනීමේ (විවෘත) තරග විභාගය - 2026**

විභාග අංකය : ☐

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

- නිවේදනයේ අංක 01 අනුව ඉල්ලුම්කරන තනතුරට අදාළ ශ්‍රේණිය (අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

III ශ්‍රේණිය - I
පුහුණු ශ්‍රේණිය (එක් වසරක) - II ☐ (මෙම ශ්‍රේණිය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.)
පුහුණු ශ්‍රේණිය (දෙවසරක) - III

- විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය (අදාළ අක්ෂරය කොටුව තුළ ලියන්න.)

සිංහල - S
දෙමළ - T ☐ (අදාළ මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.)
ඉංග්‍රීසි - E

**01** 1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) - ☐

(උදා : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

1.2 මුලකුරු සමඟ අගට යෙදෙන නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්):

☐

(උදා: H.M.S.K. GUNAWARDHANA)

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) - ☐

1.4 ජාතික හැඳුනුම්පත් අංකය - ☐

**02** 2.1 ස්ත්‍රී/පුරුෂ භාවය - ☐

**03** 3.1 විවාහක/අවිවාහක බව - ☐

3.2 උපන් දිනය - වර්ෂය : ☐ මාසය : ☐ දිනය : ☐

3.3 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන **2026.05.10** දිනට වයස,

අවුරුදු : ☐ මාස : ☐ දින : ☐

**04** 4.1 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) : ☐

ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) : ☐

4.2 විභාග ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :

i. සිංහලෙන්/දෙමළෙන් : ☐

ii. ඉංග්‍රීසි කැපිටල් අකුරින් :

4.3 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය:

4.4 බස්නාහිර පළාතේ ස්ථිරව පදිංචිව සිටින කාලසීමාව:

4.5 විද්‍යුත් තැපැල් ලිපිනය :

4.6 දුරකථන අංකය :

ස්ථාවර : | | | | | | | | | | |

ජංගම : | | | | | | | | | | |

❖ විභාගය සම්බන්ධ සියලු තොරතුරු ඉහත සඳහන් කරනු ලබන ජංගම දුරකථන අංකයට SMS ක්‍රමය මඟින් යවනු ලබන බැවින් වලංගු දුරකථන අංකයක් සඳහන් කරන්න. SMS පණිවිඩ නොලැබීම සම්බන්ධයෙන් පසුව කරනු ලබන පැමිණිලි සලකනු නොලැබේ.

**05.** **අධ්‍යාපන සුදුසුකම් -**

**5.1** අධ්‍යයන පොදු සහතික පත්‍ර **(සා.පෙළ)** පිළිබඳ විස්තරය:

| | | |
|---|---|---|
| i. විභාගයේ වර්ෂය හා මාසය : | *පළමු අවස්ථාව* | |
| | | |
| ii. විභාග අංකය | | |
| iii. ප්‍රතිඵල | ***විෂයය*** | ***සාමාර්ථය*** |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |

5.2 අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ.පෙළ) පිළිබඳ විස්තරය :

| | | |
|---|---|---|
| i. විභාගයේ වර්ෂය හා මාසය : | | |
| ii. විභාග අංකය | | |
| iii. ප්‍රතිඵල | ***විෂයය*** | ***සාමාර්ථය*** |
| | | |
| | | |
| | | |
| | | |

5.3 අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ අංක 09 ප්‍රකාරව මෙම විභාගයට පෙනී සිටීම සඳහා ඔබ ලබා ඇති වෘත්තීය සුදුසුකම් සම්බන්ධ පාඨමාලාව/ සුදුසුකම් පිළිබඳ විස්තර:

| | |
|---|---|
| I. විශ්ව විද්‍යාලය/ ආයතනය : | |
| II. පාඨමාලාවේ නම : | |
| III. කාලසීමාව : | |
| IV. පාඨමාලාව සම්පූර්ණ කළ දිනය : | |
| V. වෙනත් සුදුසුකම් : | |

**(ඉහතින් දක්වා ඇති සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාළ වන සහතික/ ලේඛන අමුණන්න)**

**06.** ඔබ කවරදාක හෝ කවර චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද? [ ]

**6.1 ඉහත පිළිතුර"ඔව්"නම් ඒ පිළිබඳ විස්තර සඳහන් කරන්න : ..................................................................**

**..........................................................................................................................................**

**07.** විභාග ගාස්තු ගෙවූ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :- ..........................................................................................

ලදුපත් අංකය :- ......................................................................

දිනය :- ......................................................................

. මෙහි ලදුපත උඩුගත (UPLOAD) කරන්න

| | |
|---|---|
| ලදුපත මෙම කොටුව තුළ නොගැලවෙන සේ අලවන්න. | **ලදුපත UPLOAD කිරීමට හැකිවන සේ සකසන්න.** |

(ප්‍රාදේශිය ලේකම් කාර්යාලයකට මුදල් ගෙවා ලබාගන්නා ලද බ.ප. 1 ලදුපත පමණක් වලංගු වේ.)

**08.** <u>අයදුම්කරුගේ සහතිකය</u>

…………………………………………………………………………………………………………………………
…………………………………………………………………… වන මා විසින් මෙම අයදුම්පතේ සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මා විසින් සපයා ඇති තොරතුරු සාවද්‍ය යැයි සොයාගනු ලැබුවහොත් බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්‍ෂණ සේවයේ තාක්‍ෂණ නිලධාරි (විදුලි) III ශ්‍රේණියේ/ පුහුණු ශ්‍රේණිය (එක් වසරක)/ පුහුණු ශ්‍රේණිය (දෙවසරක) තනතුරට පත් කිරීම සඳහා වූ මාගේ හිමිකම නොසලකා හරිනු ලැබීමට ද මට විරුද්ධව විනයානුකූලව කටයුතු කරනු ලැබීමට ද හැකි බව මම හොඳාකාරව දනිමි. තව ද සම්මුඛ පරීක්‍ෂණය පැවැත්වීම සම්බන්ධයෙන් පනවනු ලබන නීති රීතිවලට මම යටත්වන බව ද ප්‍රකාශ කරමි.

දිනය: .........................

..............................,
අයදුම්කරුගේ අත්සන.

**09.** <u>අයදුම්කරුගේ අත්සන සහතික කිරීම</u>

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන.............................................................................. මයා/ මිය/ මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු ඇය නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්, එම ලදුපත අයදුම්පතෙහි අලවා ඇති බවත්, ඔහු/ඇය ...................................වැනි දින මා ඉදිරිපිට දී ඔහු/ඇය ගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

................................................,
අත්සන සහතික කරන නිලධාරිගේ
අත්සන හා නිල මුද්‍රාව.

| | |
|---|---|
| දිනය | :................................................ |
| සහතික කරන නිලධාරියාගේ නම | :................................................ |
| තනතුර | :................................................ |
| ලිපිනය | :................................................ |

10. <u>**රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය:**</u> (අදාළ වන්නේනම් පමණක් සඳහන් කරන්න)

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ........................................................................................................ මයා/මිය/මෙනවිය දැනට ..................................................................... කාර්යාලයේ/ආයතනයේ ........................................... දින සිට මේ දක්වා ........................................................... (තනතුර) වශයෙන් ස්ථිර/තාවකාලික/අනියම් (අනවශ්‍ය වචන කපා හරින්න) තනතුරක සේවය කරන බව ද, ඔහුගේ/ඇයගේ සේවය සතුටුදායක බව ද, මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා ඇය/ ඔහු තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරින් නිදහස් කරන බවද/නොකරන බව ද, ඉහත සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බව ද සහතික කරමි.

...............................................,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ
අත්සන හා නිල මුද්‍රාව.

| | |
|---|---|
| දිනය | :................................................ |
| සහතික කරන නිලධාරියාගේ නම | :................................................ |
| තනතුර | :................................................ |
| ලිපිනය | :................................................ |

04-32/2

**බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්‍ෂණ සේවයේ තාක්‍ෂණ නිලධාරී (යාන්ත්‍රික) III ශ්‍රේණිය, පුහුණු ශ්‍රේණිය (එක් වසරක පුහුණු කාලය) සහ පුහුණු ශ්‍රේණිය (දෙවසරක පුහුණු කාලය) සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026

**01.** බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ පහත තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා බස්නාහිර පළාතේ වසර තුනක (03) අඛණ්ඩ ස්ථිර පදිංචිය ඇති පහත සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම බඳවා ගැනීමේ විවෘත තරග විභාගය, බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් ඉදිරි යෝජිත දිනයක දී පැවැත්වීමට නියමිතය. විභාගය පවත්වන දිනය පසුව දැනුම් දෙනු ලැබේ.

I. බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්‍ෂණ සේවයේ තාක්‍ෂණ නිලධාරී (යාන්ත්‍රික) III ශ්‍රේණිය
II. බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්‍ෂණ සේවයේ තාක්‍ෂණ නිලධාරී (යාන්ත්‍රික) (එක් වසරක පුහුණු කාලය)
III. බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්‍ෂණ සේවයේ තාක්‍ෂණ නිලධාරී (යාන්ත්‍රික) (දෙවසරක පුහුණු කාලය)

**02. පොදු සුදුසුකම් :-**

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

II. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

III. යම් ආගමක නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තෙකු මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.

IV. අයදුම්පත් කැඳවන අවසාන දිනට පූර්වාසන්න වසර තුන (03) ක් තුළ බස්නාහිර පළාතේ අඛණ්ඩ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.

V. සේවයට බඳවා ගැනීම සඳහා වන තරග විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු අදාළ සියලු සුදුසුකම් හා නියමිත වයස් සීමාව අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

VI. අයදුම්කරු බස්නාහිර පළාත තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

**03. වයස් සීමාව :-**

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට එනම් **2026.05.10** දිනට වයස අවුරුදු **18** ට නොඅඩු හා අවුරුදු **30** ට නොවැඩි විය යුතුය.

**04. සේවා කොන්දේසි :-**

(අ) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. තවද ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

(ආ) රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, 2020.02.26 දිනැතිව බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්‍ෂණ සේවයේ තාක්‍ෂණ නිලධාරී (යාන්ත්‍රික) තනතුරට බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියේ පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද, එම බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියේ කර ඇති හෝ මින්මතු කෙරෙන සංශෝධනවලට ද, ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි විධිවිධානවලට ද, අංක 2364/32 සහ 2023.12.29 වැනි දින දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලට ද යටත් විය යුතු වේ.

(ඇ) මෙම පත්වීම අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වේ. තාක්‍ෂණ නිලධාරී (යාන්ත්‍රික) III ශ්‍රේණියේ තනතුරකට බඳවා ගෙන වසර තුන (03) ක් ඇතුළත බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියේ සඳහන් පරිදි පළමු කාර්යක්‍ෂමතා කඩඉම් පරීක්‍ෂණය සමත් විය යුතුය.

(ඇ) 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 හා එයට වරින් වර සිදුකරන සංශෝධනයන්ට අනුව නියම කර ඇති පරිදි දෙවන රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාවය ලබා ගත යුතුය.

**05. පුරප්පාඩු ප්‍රමාණය :- 27**

**06. පවත්නා පුරප්පාඩු ක්ෂේත්‍රයන් :-**

ඉහත සඳහන් තනතුරුවල පුරප්පාඩු සඳහා බඳවා ගැනීම සම්බන්ධයෙන් අවසාන තීරණය බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

**6.1** අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනය **2026.05.10** දින වේ. අයදුම් කරන තනතුරට අදාළ සියලු සුදුසුකම් **2026.05.10** දින හෝ එදිනට පෙර සම්පූර්ණ කර තිබිය යුතුයි.

**07. බඳවා ගැනීමේ ක්‍රමය :**

- ලිඛිත තරග විභාගයක සහ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙළ අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුස්සන් තෝරනු ලැබේ.

- ලිඛිත තරග විභාගයේ ප්‍රතිඵල අනුව සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා වන සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවන අයදුම්කරුවන් නියමිත දිනයේදී සහභාගී නොවීම සම්බන්ධයෙන් කිසිඳු අයුරකින් නැවත සලකා බලනු නොලැබේ. එමෙන්ම සම්මුඛ පරීක්ෂණ දිනට සියලු සහතික ඉදිරිපත් කළ යුතු අතර, එදිනට පසුව ඉදිරිපත් කරනු ලබන කිසිඳු සහතික භාර ගනු නොලැබේ.

- පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය පත්වීම් බලධරයා විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීමට පත්වීම් බලධරයාට බලය ඇත. කිසියම් අවස්ථාවක පුරප්පාඩු සම්පූර්ණ කරන කඩඉම් ලකුණේ සම ලකුණු ලබා ගත් අයදුම්කරුවන් කිහිප දෙනෙක් සිටින අවස්ථාවක එම පුරප්පාඩු සංඛ්‍යාව පිරවීම සඳහා කඩඉම් ලකුණේ සම ලකුණු ලබා ගත් අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයකට ලක් කර එහි කුසලතාව මත එම පුරප්පාඩු ප්‍රමාණය සම්පූර්ණ කරනු ලැබේ.

- සීමිත තරග විභාගයෙන් බඳවා ගැනීමට නියමිත ප්‍රතිශතය සඳහා ප්‍රමාණවත් මූලික සුදුසුකම් සහිත අභ්‍යන්තර අයදුම්කරුවන් අදාළ දෙපාර්තමේන්තුව/ අමාත්‍යාංශය තුළ නොසිටී නම් පමණක් ඉතිරි ප්‍රමාණය විවෘත තරග විභාගය මගින්ම තෝරා ගන්නා බාහිර අයදුම්කරුවන්ගෙන්ම සම්පූර්ණ කර ගනු ලැබේ.

- පුහුණු කාලසීමාව අවසානයේදී III ශ්‍රේණියට බඳවා ගැනීම.

(අ) විවෘත ධාරාව හෝ සීමිත ධාරාව හෝ යටතේ පුහුණු කිරීමේ ශ්‍රේණියට ඇතුළත් කරගනු ලබන අයදුම්කරුවන් අදාළ බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් පුහුණු කාලසීමාව සාර්ථක ලෙස සම්පූර්ණ කිරීමෙන් අනතුරුව බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන විභාගය සමත් වීමෙන් පසු සේවයේ III ශ්‍රේණියට බඳවා ගනු ලැබේ.

(ආ) පුහුණුව අවසානයේ පවත්වනු ලබන විභාගය සමත් වීමට අපොහොසත් වන ආධුනිකයින් වෙතොත් ඔවුනට මාස 06 කට නොවැඩි කාලයක් සඳහා සිය පුහුණු කාලය දීර්ඝ කරවා ගැනීමට අවස්ථාව ඇත. එසේ දීර්ඝ කරනු ලබන කාල සීමාව අවසානයේ නැවත පවත්වනු ලබන විභාගය අසමත් වන විවෘත ධාරාව යටතේ අයදුම්කළ ආධුනිකයන්ගේ සේවය අවසන් කරනු ලැබේ.

08. මාසික වැටුප් පරිමාණය :-

- III ශ්‍රේණිය — MN 03 – 2025
  රු. 52,250 - 10 X 800 - 11X 1,190- 10 X 1,320 -10X1,350 - රු. 100,040/-
  (රා.පරි.ච. 10/2025 හි උපලේඛන III අනුව ගෙවනු ලැබේ.)

- පුහුණු ශ්‍රේණිය (එක් වසරක පුහුණු කාලය) - 2026.01.01 දිනට වන මාසික දීමනාව රු. 43,274/-

- පුහුණු ශ්‍රේණිය (දෙවසරක පුහුණු කාලය) - 2026.01.01 දිනට වන මාසික දීමනාව රු. 43,730/-
  (මාසික දීමනා රා.පරි.ච.10/2025 හි උපලේඛන VI අනුව ගෙවනු ලැබේ.)

**09. මූලික සුදුසුකම් :-**

| *තනතුර* | *සුදුසුකම්* |
|---|---|
| **බස්නාහිර පළාත් සහා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ (යාන්ත්‍රික)**<br>➢ III ශ්‍රේණිය | **(අ) අධ්‍යාපන සුදුසුකම් :**<br><br>අ.පො.ස. (උ.පෙළ) විභාගයේදී විද්‍යා/ගණිත විෂය ධාරාව යටතේ රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සංයුක්ත ගණිතය යන විෂයන් අතුරින් විෂයන් දෙකක් සහිතව විෂයයන් තුනකින් එකවර සමත්ව තිබීම හෝ තාක්ෂණවේදය විෂය ධාරාව යටතේ ඉංජිනේරු තාක්ෂණවේදය, තාක්ෂණවේදය සඳහා විද්‍යාව, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යන විෂයයන් අතුරින් විෂයයන් දෙකක් සහිතව විෂයයන් තුනකින් එකවර සමත්වීම.<br><br>*සහ*<br><br>සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හය (06) කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගය සමත්ව තිබීම.<br><br>**(ආ) වෘත්තීය සුදුසුකම් :**<br><br>1. මොරටුව විශ්වවිද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික (යාන්ත්‍රික) ඩිප්ලෝමාව ;<br><br>*හෝ*<br><br>2. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව (යාන්ත්‍රික) ;<br><br>*හෝ*<br><br>3. අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව (යාන්ත්‍රික) ;<br>*හෝ*<br><br>4. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව (යාන්ත්‍රික) ;<br><br>*හෝ*<br><br>5. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ පළමු වන කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම ;<br><br>*හෝ*<br><br>6. රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 06 වන මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම ;<br><br>7. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම. |

| | |
|---|---|
| ➢ පුහුණු ශ්‍රේණිය (එක් වසරක පුහුණු කාලය) | **(අ) අධ්‍යාපන සුදුසුකම්**<br><br>අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී විද්‍යා/ගණිත විෂය ධාරාව යටතේ රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සංයුක්ත ගණිතය යන විෂයයන් අතුරින් විෂයයන් දෙකක් සහිතව විෂයයන් තුනකින් එකවර සමත්ව තිබීම හෝ තාක්‍ෂණවේදය විෂය ධාරාව යටතේ ඉංජිනේරු තාක්‍ෂණවේදය, තාක්‍ෂණවේදය සඳහා විද්‍යාව, තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණය යන විෂයයන් අතුරින් විෂයයන් දෙකක් සහිතව විෂයයන් තුනකින් එකවර සමත්වීම ;<br><br>*සහ*<br><br>සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හය (06) කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගය සමත්ව තිබීම.<br><br>**(ආ) වෘත්තීය සුදුසුකම්**<br><br>01. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක යාන්ත්‍රික ක්ෂේත්‍රයේ වසර 03 ක පාඨමාලාවක් සාර්ථකව හදාරා ජාතික තාක්‍ෂණ සහතිකය (යාන්ත්‍රික) ලබා තිබීම ;<br><br>*හෝ*<br><br>02. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක යාන්ත්‍රික ක්ෂේත්‍රයේ කර්මාන්ත තාක්‍ෂණිකයන් සඳහා වූ වසර 02 ක ජාතික සහතික පත්‍ර පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර අදාළ සහතිකය ලබා තිබීම ;<br><br>*හෝ*<br><br>03. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්‍ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්‍ෂණික සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්‍ෂණික සුදුසුකම් ලබා තිබීම |
| ➢ පුහුණු ශ්‍රේණිය (දෙවසරක පුහුණු කාලය) | **(අ) අධ්‍යාපන සුදුසුකම් :**<br><br>අ.පො.ස. (උ.පෙළ) විභාගයේදී විද්‍යා/ගණිත විෂය ධාරාව යටතේ රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, සංයුක්ත ගණිතය යන විෂයයන් අතුරින් විෂයයන් දෙකක් සහිතව විෂයයන් තුනකින් එකවර සමත්ව තිබීම හෝ තාක්‍ෂණවේදය විෂය ධාරාව යටතේ ඉංජිනේරු තාක්‍ෂණවේදය, තාක්‍ෂණවේදය සඳහා විද්‍යාව, තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණය යන විෂයයන් අතුරින් විෂයයන් දෙකක් සහිතව විෂයයන් තුනකින් එකවර සමත්වීම ;<br><br>*සහ*<br><br>සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව , විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගය සමත්ව තිබීම. |

*සටහන :*

i) III ශ්‍රේණියට සෘජුව බඳවා ගැනීම සහ පුහුණු ශ්‍රේණියට බඳවා ගැනීම යන ක්‍රම දෙකින්ම බඳවා ගන්නා විට බඳවා ගැනීමේ ශ්‍රේණිය වන III ශ්‍රේණියට පළමුව බඳවා ගනු ලැබේ.

ii) III ශ්‍රේණියට සුදුසුකම් ලබන අයදුම්කරුවන් සංඛ්‍යාව පුරප්පාඩු සංඛ්‍යාවට ප්‍රමාණවත් නොවන විට, ඉතිරි පුරප්පාඩු සඳහා පුහුණු ශ්‍රේණියට අදාළ සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් පුහුණු කිරීමේ ශ්‍රේණියට ඇතුළත් කර ගනු ලැබේ.

iii) පුහුණු ශ්‍රේණිය එක් වසරක පුහුණු කාලය හා දෙවසරක පුහුණු කාලය අවසානයේ පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයේ ලකුණු පදනම් කර ගනිමින් III ශ්‍රේණියට පත්කිරීමේ දී ජ්‍යෙෂ්ඨත්වය තීරණය කරනු ලබයි.

**10. ලිඛිත තරග විභාගය පිළිබඳ විස්තර :**

❖ **පුහුණු කිරීමේ ශ්‍රේණිය (එක් වසරක පුහුණුව සඳහා) සහ III ශ්‍රේණිය සඳහා**

| *විෂයය සහ විෂය නිර්දේශය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| **බුද්ධි පරීක්ෂණය :**<br><br>අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලභාවයත්, සිතීමේ විශ්ලේෂණ තත්ත්වයත් තීරණ ගැනීමේ ශක්තියත්, විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්න වලින් යුක්තය. | පැය 01 | 100 | 40% |
| **විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය**<br><br>වාහන යන්ත්‍රෝපකරණ නඩත්තු කිරීම හා අලුත්වැඩියා කිරීම සම්බන්ධ මූලධර්ම, වාහන හා සම්බන්ධ පද්ධතීන් සම්බන්ධ දැනුම, ලෝහ කර්මාන්ත හා ලෝහවල ලක්ෂණ, එන්ජින් සිසිලන කාරක පිළිබඳ දැනුම, මිනුම් උපකරණ භාවිතය, යන්ත්‍ර ආයුධ, කපන ආයුධ දැනුම නිර්මාණාත්මක යන්ත්‍රෝපකරණ හා යාන්ත්‍රික ඇඳීම හා පිටපත් කිරීම පිළිබඳව දැනුම හා අපේක්ෂකයා අත්පත් කර ගත යුතු හැකියාවන් නිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්න වලින් යුක්ත වේ. | පැය 03 | 100 | 40% |

❖ **පුහුණු කිරීමේ ශ්‍රේණිය (දෙවසරක පුහුණුව සඳහා)**

| *විෂයය සහ විෂය නිර්දේශය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| **බුද්ධි පරීක්ෂණය**<br><br>අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලභාවයත්, සිතීමේ විශ්ලේෂණ තත්ත්වයත් තීරණ ගැනීමේ ශක්තියත්, විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්න වලින් යුක්තය. | පැය 02 | 100 | 40% |

**11. විභාග ප්‍රතිඵල :-**

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ප්‍රතිඵල දැන්වීම www.psc.wp.gov.lk වෙබ් අඩවිය මගින් නිකුත් කරනු ඇත.

**12. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :-**

ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු - මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම හා කායික යෝග්‍යතාවය පරීක්ෂා කිරීම සඳහා පවත්වනු ලැබේ. ලකුණු ලබා දෙනු නොලැබේ.

**පත්කිරීම් බලධරයා - බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

**13. විභාග ගාස්තු :-**

සෑම අයදුම්කරුවෙකුම විභාග ගාස්තුවක් බස්නාහිර පළාත් සභාවට ගෙවිය යුතුය. විභාගය සඳහා විභාග ගාස්තුව රු. **1,200/=**කි. මෙම විභාග ගාස්තුව බස්නාහිර පළාත් සභා ආදායම් ශීර්ෂ **20-03-02-99** ට බැර වන ලෙස අයදුම්පත්‍ර භාරගනු ලබන අවසාන දිනට හෝ ඊට ප්‍රථම බස්නාහිර පළාත තුළ පිහිටා ඇති ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදලින් ගෙවා ඔබගේ නමින් ලබා ගන්නා (බ.ප. 1) ලදුපත අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ අලවා තිබිය යුතුය. එහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. මෙම විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව කුමන කරුණක් නිසාවත් සම්පූර්ණයෙන්ම හෝ අර්ධ වශයෙන් හෝ ආපසු ගෙවනු නොලැබේ. තවද විභාග ගාස්තුව සඳහා මුද්දර හෝ මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.

**14. අයදුම්කළ යුතු පිළිවෙල:-**

I. සියලුම අයදුම්කරුවන් www.psc.wp.gov.lk යන බස්නාහිර පළාත් අපගේ නිල වෙබ් අඩවියට පිවිස මෙම විභාග නිවේදනය අනුව නිල වෙබ් අඩවියට උඩුගත (Upload) කර ඇති අයදුම්පත බාගත කිරීම සිදුකළ හැකිය.

II. අසම්පූර්ණ ලෙස තොරතුරු යොමු කර ඇති අයදුම්පත්, මූලික සුදුසුකම් සපුරා නොමැති අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරේ. සම්පූර්ණ කර එවනු ලබන අයදුම්පතෙහි ඡායා පිටපතක් අයදුම්කරු සතුව තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.

III. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :-

අයදුම්පතේ අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවෙකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා සහතික කරවා ගත යුතු අතර අයදුම්පත ආයතන ප්‍රධානියා මගින් යොමු කළ යුතුය. එසේ නොවන අයදුම්කරුවකු තම අත්සන රජයේ පාසලක විදුහල්පතිවරයකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියකු, රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍යාගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයෙකු ලවා සහතික කරනු ලැබ තිබිය යුතුය.

IV. මාර්ගගත ක්‍රමය ඔස්සේ අයදුම්පත් යොමු කළ හැකි අවසාන දිනය - **2026.05.10**

V. අපගේ නිල වෙබ් අඩවියට පිවිස මාර්ගගත ක්‍රමය මගින් **2026.05.10** දිනට ප්‍රථම අයදුම්පත් යොමු කිරීම සිදු කළ යුතු අතර, නිවැරදිව සම්පූර්ණ කර බාගත කර ගන්නා ලද අයදුම්පත් අයදුම්කරුගේ අත්සන සහිතව හා අත්සන සහතික කර ගැනීමෙන් අනතුරුව **2026.05.15** දිනට හෝ ඊට පෙර ලැබෙන සේ පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. මෙදිනට පසුව ලැබෙන අයදුම්පත් භාර ගනු නොලැබේ.

ලේකම්,
බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
(බඳවා ගැනීම් අංශය),
අංක 628, 10 මහල,
ජනජය සිටි ගොඩනැඟිල්ල,
නාවල පාර, රාජගිරිය.

- අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරි (යාන්ත්‍රික) III ශ්‍රේණිය, පුහුණු ශ්‍රේණිය (එක් වසරක පුහුණු කාලය), පුහුණු ශ්‍රේණිය (දෙවසරක පුහුණු කාලය) සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026"** යන්න අනිවාර්යයෙන්ම සඳහන් කළ යුතුය.

VI. අයදුම්පතක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේදී නැතිවූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ. අවසාන දිනය දක්වා අයදුම්පත් ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි හානිය අයදුම්කරුවන් විසින් විඳදරා ගත යුතුය. එමෙන්ම අයදුම්පත් ලැබුණු බව දන්වනු නොලැබේ.

VII. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් කිසිදු අයුරකින් සලකා බලනු නොලැබේ.

VIII. මෙම නිවේදනයෙන් ආවරණය නොවන කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳව තීරණය කිරීමේ අයිතිය ද කිසියම් පුරප්පාඩුවලින් කොටසක් හෝ මුළුමනින්ම පිරවීම හෝ නොපිරවීම හෝ පිළිබඳව අවසන් තීරණය ගැනීමේ අයිතිය බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ. එසේම මෙම බඳවාගැනීම කල් දැමීම, අවලංගු කිරීම හෝ පැවැත්වීමෙන් පසු තෝරා ගැනීම/ නොගැනීම පිළිබඳව අවසන් තීරණය බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

IX. ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත පරිදි අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් පමණක් ලිඛිත පරීක්ෂණයන් සඳහා කැඳවනු ඇත. මේ සඳහා අයදුම් කරනු ලබන සියලුම අයදුම්කරුවන් සුදුසුකම් සම්පූර්ණ කර ඇතැයි උපකල්පනය කර ලිඛිත පරීක්ෂණය සඳහා සහභාගී වීමට අවස්ථාව දෙනු ලැබේ. ලිඛිත පරීක්ෂණය සඳහා සහභාගී වීමට අවස්ථාව ලබා දීම, සුදුසුකම් සම්පූර්ණ කර ඇති බවට පිළිගැනීමක් වශයෙන් නොසැලකිය යුතු ය. එසේ වුවද අයදුම්කරු සුදුසුකම් සම්පූර්ණ කර නොමැති බව අනාවරණය වන ඕනෑම අවස්ථාවක දී අපේක්ෂකත්වය අවලංගු කිරීමට හා පත්වීම ලබා දීම ප්‍රතික්ෂේප කිරීමේ බලය බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

**15. විභාගයට ඇතුලත් කර ගැනීම :**

*(අ)* විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් විසින් තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය පළමුවෙන්ම එම ශාලාවේ පෙනී සිටින විභාග දිනයේදී එහි විභාග මධ්‍යස්ථාන භාර ශාලාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එවැනි ප්‍රවේශ පත්‍රයක් ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ.

*(ආ)* අපේක්ෂකයෙකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදී ම විභාගයට පෙනී සිටිය යුතුය.

*සටහන :- අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීම සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.*

**16. අපේක්ෂකයින්ගේ අනන්‍යතාව :**

ප්‍රවේශ පත්‍රයක් නොමැති කිසිදු අයදුම්කරුවෙකුට විභාගයට පෙනී සිටීමට අවස්ථාව නොලැබේ. තවද, අයදුම්කරුවන් විභාග ශාලාව තුළ දී පෙනී සිටින සෑම ප්‍රශ්න පත්‍රයක් සඳහා ම විභාග ශාලාධිපති සෑහීමට පත් වන පරිදි ස්වකීය අනන්‍යතාවය ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් ලියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

(i) ජාතික හැඳුනුම්පත
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය
(iii) වලංගු රියදුරු බලපත්‍රය

විභාග අපේක්ෂකයින්ගේ අනන්‍යතාව තහවුරු කර ගත හැකිවන පරිදි මුහුණ හා ඉලෙක්ට්‍රෝනික සන්නිවේදන උපාංග පැළඳ ගෙන නොමැති බව සනාථ කිරීම සඳහා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තවද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

**17. සාවද්‍ය තොරතුරු සැපයීම :**

මෙම විභාගයට ඉදිරිපත්වීම සඳහා කිසියම් අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ හෝ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. තවද, කිසියම් අපේක්ෂකයෙකු විසින් ඉදිරිපත් කරන ලද යම් තොරතුරක්

සාදව්‍ය බව දැන දැනම ඉදිරිපත් කළ බව පෙනී ගියහොත් ඔහු හෝ ඇය සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කරනු ලැබේ.

(i) අයදුම්පත පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයට අදාළ රෙගුලාසි අනුව කිසියම් අපේක්ෂකයෙකු ඊට පෙනී සිටීමට නුසුදුසු වෙතැයි පෙනී යන ලද නම්, විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ ඊට පසු හෝ යන කවර අවස්ථාවක දී වුව ද ඔහුගේ/ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය.

(ii) අපේක්ෂකයෙකු විසින් සපයන ලද තොරතුරු පසු කලක දී වැරදි බව පෙනී ගියහොත් හෝ ඔහු/ ඇය විසින් හිතාමතාම කිසියම් කරුණක් වසන් කරන ලද බව හෙළිවුවහොත් හෝ ඔහුට/ ඇයට පත්වීමක් ලබා දීම සම්බන්ධයෙන් තවදුරටත් සලකා බලනු නොලබන අතර, මෙම විභාගය හේතු කොට ගෙන දී තිබූ පත්වීමක් අහෝසි කිරීමට හෝ රජයේ සේවයෙන් පහ කිරීමට වුව ද යටත් වේ.

18. විභාගය පැවැත්වීම සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීති රීති වලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන ඕනෑම දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

19. විභාගය පැවැත්වීම, විභාගය අවලංගු කිරීම හෝ විභාගයේ ප්‍රතිඵල අත්හිටුවීම සහ ඊට අනුෂාංගිකව විභාග නිවේදනයේ විධිවිධාන සලසා නොමැති වෙනත් කවර හෝ කරුණක් සම්බන්ධයෙන් බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වන්නේය. සියලුම අයදුම්කරුවන් මෙම නිවේදනයේ සඳහන් නීති රීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

20. මෙම නිවේදනයේ සඳහන් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි.

තිලක් සෙනරත්,
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

2026 මාර්තු මස 27 දින,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.),
අංක: 628, 10 මහල,
ජන ජය සිටි ගොඩනැඟිල්ල,
නාවල පාර, රාජගිරිය.

(මෙම දැන්වීම පදනම් කරගෙන විවිධ ආයතන විසින් සාවද්‍ය ලෙස සකස් කර ඉදිරිපත් කරනු ලබන දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව කිසිදු වගකීමක් දරනු නොලැබේ.)

<u>ආදර්ශ අයදුම්පත්‍රය</u>

**බස්නාහිර පළාත් සහා රාජ්‍ය සේවයේ (යාන්ත්‍රික) III, පුහුණු ශ්‍රේණිය (එක් වසරක පුහුණු කාලය) සහ පුහුණු ශ්‍රේණිය (දෙවසරක පුහුණු කාලය) සඳහා බඳවා ගැනීමේ (විවෘත) තරග විභාගය - 2026**

විභාග අංකය : [ ]

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

- නිවේදනයේ අංක 01 අනුව ඉල්ලුම්කරන තනතුරට අදාළ ශ්‍රේණිය (අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

III ශ්‍රේණිය - I

පුහුණු ශ්‍රේණිය (එක් වසරක) - II [ ] (මෙම ශ්‍රේණිය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ)

පුහුණු ශ්‍රේණිය (දෙවසරක) - III

- විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය (අදාළ අක්ෂරය කොටුව තුළ ලියන්න)

සිංහල - S

දෙමළ - T [ ] (අදාළ මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ)

ඉංග්‍රීසි - E

**01.** 1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) : [ ]

(උදා : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

1.2 මුලකුරු සමඟ අගට යෙදෙන නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්):

[ ]

(උදා: H.M.S.K. GUNAWARDHANA)

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) : [ ]

1.4 ජාතික හැඳුනුම්පත් අංකය : [ ]

**02.** 2.1 ස්ත්‍රී/පුරුෂ භාවය : [ ]

**03.** 3.1 විවාහක/අවිවාහක බව : [ ]

3.2 උපන් දිනය : වර්ෂය : [ ] මාසය : [ ] දිනය : [ ]

3.3 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන **2026.05.10** දිනට වයස,

අවුරුදු : [ ] මාස : [ ] දින : [ ]

**04.** 4.1 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) : [ ]

ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) : [ ]

4.2 විභාග ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :

i. සිංහලෙන්/දෙමළෙන් :

ii. ඉංග්‍රීසි කැපිටල් අකුරින් :

4.3 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :

4.4 බස්නාහිර පළාතේ ස්ථිරව පදිංචිව සිටින කාල සීමාව :

4.5 විද්‍යුත් තැපැල් ලිපිනය :

4.6 දුරකථන අංකය :

ස්ථාවර : | | | | | | | | | | |    ජංගම : | | | | | | | | | | |

❖ විභාගය සම්බන්ධ සියලු තොරතුරු ඉහත සඳහන් කරනු ලබන ජංගම දුරකථන අංකයට SMS ක්‍රමය මඟින් යවනු ලබන බැවින් වලංගු දුරකථන අංකයක් සඳහන් කරන්න. SMS පණිවිඩ නොලැබීම සම්බන්ධයෙන් පසුව කරනු ලබන පැමිණිලි සලකනු නොලැබේ.

**05. අධ්‍යාපන සුදුසුකම් :**

5.1 අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගය පිළිබඳ විස්තරය :

| | | |
|---|---|---|
| i. විභාගයේ වර්ෂය හා මාසය: | *පළමු අවස්ථාව* | |
| | | |
| ii. විභාග අංකය : | | |
| iii. ප්‍රතිඵල : | ***විෂයය*** | ***සාමාර්ථය*** |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |

5.2 අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ.පෙළ) විභාගය පිළිබඳ විස්තර :

| | | |
|---|---|---|
| i. විභාගයේ වර්ෂය හා මාසය: | | |
| ii. විභාග අංකය : | | |
| iii. ප්‍රතිඵල : | ***විෂයය*** | ***සාමාර්ථය*** |
| | | |
| | | |
| | | |
| | | |

5.3 අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ අංක 09 ප්‍රකාරව මෙම විභාගයට පෙනී සිටීම සඳහා ඔබ ලබා ඇති වෘත්තීය සුදුසුකම් සම්බන්ධ පාඨමාලාව/ සුදුසුකම් පිළිබඳ විස්තර:

I. විශ්ව විද්‍යාලය/ ආයතනය :

II. පාඨමාලාවේ නම :

III. කාල සීමාව :

IV. පාඨමාලාව සම්පූර්ණ කළ දිනය :

V. වෙනත් සුදුසුකම් :

**(ඉහතින් දක්වා ඇති සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාළ වන සහතික/ ලේඛන අමුණන්න)**

**06.** ඔබ කවරදාක හෝ කවර චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද?

**6.1** ඉහත පිළිතුර"ඔව්"නම් ඒ පිළිබඳ විස්තර සඳහන් කරන්න : ..................................................................................

..................................................................................................................................................................

**07.** විභාග ගාස්තු ගෙවූ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය : ........................................................................................................

ලදුපත් අංකය : ........................................................................

දිනය : .....................................................................................

. මෙහි ලදුපත උඩුගත (UPLOAD) කරන්න

| ලදුපත මෙම කොටුව තුළ නොගැලවෙන සේ අලවන්න. | ලදුපත UPLOAD කිරීමට හැකිවන සේ සකසන්න. |
|---|---|

(ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදල් ගෙවා ලබාගන්නා ලද බ.ප. 1 ලදුපත පමණක් වලංගු වේ.)

**08. අයදුම්කරුගේ සහතිකය**

…………………………………………………………………………………………………………………………
…………………………………………………………… වන මා විසින් මෙම අයදුම්පතේ සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මා විසින් සපයා ඇති තොරතුරු සාවද්‍ය යැයි සොයාගනු ලැබුවහොත් බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්‍ෂණ සේවයේ තාක්‍ෂණ නිලධාරි (යාන්ත්‍රික) III ශ්‍රේණියේ/ පුහුණු ශ්‍රේණිය (එක් වසරක)/ පුහුණු ශ්‍රේණිය (දෙවසරක) තනතුරට පත් කිරීම සඳහා වූ මාගේ හිමිකම නොසලකා හරිනු ලැබීමට ද, මට විරුද්ධව විනයානුකූලව කටයුතු කරනු ලැබීමට ද හැකි බව මම හොඳාකාරව දනිමි. තව ද සම්මුඛ පරීක්‍ෂණය පැවැත්වීම සම්බන්ධයෙන් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

දිනය: ........................ .................................,
අයදුම්කරුගේ අත්සන.

**09. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම**

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන..................................................................... මයා/ මිය/ මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු ඇය නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්, එම ලදුපත අයදුම්පතෙහි අලවා ඇති බවත් , ඔහු/ ඇය .................................වැනි දින මා ඉදිරිපිට දී ඔහු/ඇය ගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

................................................,
අත්සන සහතික කරන නිලධාරිගේ
අත්සන හා නිල මුද්‍රාව.

දිනය :................................................
සහතික කරන නිලධාරියාගේ නම :................................................
තනතුර :................................................
ලිපිනය :................................................

10. **රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය** (අදාළ වන්නේනම් පමණක් සඳහන් කරන්න)

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ..................................................................................... මයා/මිය/මෙනවිය දැනට ........... .................................................... කාර්යාලයේ/ආයතනයේ .................................. දින සිට මේ දක්වා ............................ ......................... (තනතුර) වශයෙන් ස්ථිර/තාවකාලික/අනියම් (අනවශ්‍ය වචන කපා හරින්න) තනතුරක සේවය කරන බවද, ඔහුගේ/ඇයගේ සේවය සතුටුදායක බව ද, මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා ඇය/ඔහු තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරින් නිදහස් කරන බව ද/නොකරන බව ද, ඉහත සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බව ද සහතික කරමි.

................................................,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ
අත්සන හා නිල මුද්‍රාව.

දිනය :................................................
සහතික කරන නිලධාරියාගේ නම :................................................
තනතුර :................................................
ලිපිනය :................................................

04-32/3

## බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්‍ෂණ සේවයේ තාක්‍ෂණ නිලධාරී (සිවිල්) III ශ්‍රේණිය, පුහුණු ශ්‍රේණිය (එක් වසරක පුහුණු කාලය) සහ පුහුණු ශ්‍රේණිය (දෙවසරක පුහුණු කාලය) සඳහා බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය - 2026

01. බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ පහත තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ සුදුසුකම් ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය, බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් ඉදිරි යෝජිත දිනයක දී පැවැත්වීමට නියමිතය. විභාගය පවත්වන දිනය පසුව දැනුම් දෙනු ලැබේ.

I. බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්‍ෂණ සේවයේ තාක්‍ෂණ නිලධාරී (සිවිල්) III ශ්‍රේණිය
II. බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්‍ෂණ සේවයේ තාක්‍ෂණ නිලධාරී (සිවිල්) (එක් වසරක පුහුණු කාලය)
III. බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්‍ෂණ සේවයේ තාක්‍ෂණ නිලධාරී (සිවිල්) (දෙවසරක පුහුණු කාලය)

**02. පොදු සුදුසුකම් :-**

2.1 පත්වීම ස්ථිර කර තිබිය යුතුය.
2.2 නියමිත දිනට බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ දෙපාර්තමේන්තුගත ස්ථිර තනතුරක යටත් පිරිසෙයින් වසර පහ (05) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතු අතර ඒ බව දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කර තිබීම.
2.3 බස්නාහිර පළාත් පාලන චක්‍රලේඛ 04/2021 හි සඳහන් විධි විධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.
2.4 සේවයට බඳවා ගැනීම සඳහා වන ලිඛිත පරීක්‍ෂණයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ නිලධාරියා සියළු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.
2.5 අයදුම්කරු බස්නාහිර පළාත තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

**03. වයස් සීමාව** :- දැනටමත් බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ නියුතු වූවන්ගෙන් බඳවා ගන්නා බැවින් වයස් සීමාවක් අදාළ නොවේ.

**04. සේවා කොන්දේසි :-**

*(අ)* 2020.06.24 දිනැතිව බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්‍ෂණ සේවයේ තාක්‍ෂණ නිලධාරී (සිවිල්) තනතුරට බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියේ පනවා ඇති නියමයන් හා කොන්දේසි වලට ද, එම බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියේ කර ඇති හෝ මින්මතු කෙරෙන සංශෝධනවලට ද යටත් වේ.

*(ආ)* මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. තවද ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය මඟින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

*(ඇ)* ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි විධිවිධානවලට ද, අංක 2364/32 සහ 2023.12.29 වැනි දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලට ද, චක්‍රලේඛ හා උපදෙස් වලටද, ඒවාට අදාළ වරින් වර නිකුත් කරනු ලබන සංශෝධනවලටද යටත් විය යුතු වේ.

**05. පුරප්පාඩු ප්‍රමාණය :- 73**

**06. පවත්නා පුරප්පාඩු ක්ෂේත්‍රයන් :-**

ඉහත සඳහන් තනතුරුවල පුරප්පාඩු සඳහා බඳවා ගැනීම සම්බන්ධයෙන් අවසාන තීරණය බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

6.1 අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනය **2026.05.10** දින වේ. අයදුම් කරන තනතුරට අදාළ සියලු සුදුසුකම් **2026.05.10** දින හෝ එදිනට පෙර සම්පූර්ණ කර තිබිය යුතුයි.

**07.** බඳවා ගැනීමේ ක්‍රමය

- ලිඛිත තරඟ විභාගයක සහ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුස්සන් තෝරනු ලැබේ.

- ලිඛිත තරඟ විභාගයේ ප්‍රතිඵල අනුව සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා වන සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවන අයදුම්කරුවන් නියමිත දිනයේදී සහභාගී නොවීම සම්බන්ධයෙන් කිසිඳු අයුරකින් නැවත සලකා බලනු නොලැබේ. එමෙන්ම සම්මුඛ පරීක්ෂණ දිනට සියළු සහතික ඉදිරිපත් කළ යුතු අතර, එදිනට පසුව ඉදිරිපත් කරනු ලබන කිසිඳු සහතික භාර ගනු නොලැබේ.

- පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය පත්වීම් බලධරයා විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීමට පත්වීම් බලධරයාට බලය ඇත. කිසියම් අවස්ථාවක පුරප්පාඩු සම්පූර්ණ කරන කඩඉම් ලකුණේ සම ලකුණු ලබා ගත් අයදුම්කරුවන් කිහිප දෙනෙක් සිටින අවස්ථාවක එම පුරප්පාඩු සංඛ්‍යාව පිරවීම සඳහා කඩඉම් ලකුණේ සම ලකුණු ලබා ගත් අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයකට ලක් කර එහි කුසලතාව මත එම පුරප්පාඩු ප්‍රමාණය සම්පූර්ණ කරනු ලැබේ.

- සීමිත තරඟ විභාගයෙන් බඳවා ගැනීමට නියමිත ප්‍රතිශතය සඳහා ප්‍රමාණවත් මූලික සුදුසුකම් සහිත අභ්‍යන්තර අයදුම්කරුවන් අදාළ දෙපාර්තමේන්තුව/ අමාත්‍යාංශය තුළ නොසිටි නම් පමණක් ඉතිරි ප්‍රමාණය විවෘත තරඟ විභාගය මගින්ම තෝරා ගන්නා බාහිර අයදුම්කරුවන්ගෙන්ම සම්පූර්ණ කර ගනු ලැබේ.

- මෙම විභාගය සඳහා විශේෂ අවශ්‍යතා සහිත අයදුම්කරුවන් ඉදිරිපත් වන්නේ නම් ඒ බව අයදුම්පතේ අනිවාර්යයෙන් සඳහන් කළ යුතු අතර, අදාළ වෛද්‍ය සහතිකවල පිටපත් අයදුම්පතේ මුද්‍රිත පිටපතක් සමඟ බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ලියාපදිංචි තැපැල මඟින් ඉදිරිපත් කළ යුතුය.

- පුහුණු කාලසීමාව අවසානයේදී III ශ්‍රේණියට බඳවා ගැනීම.

  *(අ)* විවෘත ධාරාව හෝ සීමිත ධාරාව හෝ යටතේ පුහුණු කිරීමේ ශ්‍රේණියට ඇතුළත් කරගනු ලබන අයදුම්කරුවන් අදාළ බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් පුහුණු කාලසීමාව සාර්ථක ලෙස සම්පූර්ණ කිරීමෙන් අනතුරුව බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන විභාගය සමත් වීමෙන් පසු සේවයේ III ශ්‍රේණියට බඳවා ගනු ලැබේ.

  *(ආ)* පුහුණුව අවසානයේ පවත්වනු ලබන විභාගය සමත් වීමට අපොහොසත් වන ආධුනිකයින් වෙතොත් ඔවුනට මාස 06 කට නොවැඩි කාලයක් සඳහා සිය පුහුණු කාලය දීර්ඝ කරවා ගැනීමට අවස්ථාව ඇත. එසේ දීර්ඝ කරනු ලබන කාල සීමාව අවසානයේ නැවත පවත්වනු ලබන විභාගය අසමත් වන විවෘත ධාරාව යටතේ අයදුම්කළ ආධුනිකයන්ගේ සේවය අවසන් කරනු ලැබේ.

08. මාසික වැටුප් පරිමාණය :-

- III ශ්‍රේණිය MN 03 – 2025
  රු. 52,250 - 10 X 800 - 11X 1,190- 10 X 1,320 -10X1,350 - රු. 100,040/-

  (රා.පරි.ච. 10/2025 හි උපලේඛන III අනුව ගෙවනු ලැබේ.)

- පුහුණු ශ්‍රේණිය (එක් වසරක පුහුණු කාලය) - 2026.01.01 දිනට වන මාසික දීමනාව රු. 43,274/-

- පුහුණු ශ්‍රේණිය (දෙවසරක පුහුණු කාලය) - 2026.01.01 දිනට වන මාසික දීමනාව රු. 43,730/-

(මාසික දීමනා රා.පරි.ච.10/2025 හි උපලේඛන VI අනුව ගෙවනු ලැබේ.

**09. මූලික සුදුසුකම් :-**

| තනතුර | සුදුසුකම් |
|---|---|
| **බස්නාහිර පළාත් සහා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ (සිවිල්)**<br>➢ III ශ්‍රේණිය (**සෘජු බඳවා ගැනීම**) | **(අ) අධ්‍යාපන සුදුසුකම්**<br>සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව , විද්‍යාව, ගණිතය යන විෂයයනට සම්මාන සාමාර්ථයන් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගය විෂයයන් හය (06) කින් සමත්වීම.<br><br>**(ආ) වෘත්තීය සුදුසුකම්**<br><br>1. මොරටුව විශ්ව විද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික (සිවිල්) ඩිප්ලෝමාව;<br>හෝ<br>2. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව (සිවිල්);<br>හෝ<br>3. අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව (සිවිල්);<br>හෝ<br>4. ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව (සිවිල්);<br>හෝ<br>5. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ පළමු වන කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම;<br>හෝ<br>6. රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 06 වන මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම;<br><br>7. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියළු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.<br><br>**(ඇ) පළපුරුද්ද**<br>බස්නාහිර පළාත් සහා රාජ්‍ය සේවයේ ප්‍රාථමික හෝ ඉන් ඉහළ සේවා ගණයක ස්ථිර දෙපාර්තමේන්තුගත තනතුරක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් **වසර 05 ක** සක්‍රීය හා සතුටුදායක සේවා පළපුරුද්දක් තිබීම. |
| ➢ පුහුණු ශ්‍රේණිය (එක් වසරක පුහුණු කාලය) | **(අ) අධ්‍යාපන සුදුසුකම්**<br>සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව , විද්‍යාව, ගණිතය යන විෂයයනට සම්මාන සාමාර්ථයන් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගය විෂයයන් හය (06) කින් සමත්වීම. |

| තනතුර | සුදුසුකම් |
|---|---|
| ➢ පුහුණු ශ්‍රේණිය (එක් වසරක පුහුණු කාලය) | **(ආ) වෘත්තීය සුදුසුකම්**<br><br>1.තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක සිවිල් ක්ෂේත්‍රයේ වසර 03 ක පාඨමාලාවක් සාර්ථකව හදාරා ජාතික තාක්ෂණ සහතිකය (සිවිල්) ලබා තිබීම;<br><br>හෝ<br><br>02. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක සිවිල් ක්ෂේත්‍රයේ කර්මාන්ත තාක්ෂණිකයන් සඳහා වූ වසර 02 ක ජාතික සහතික පත්‍ර පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර අදාළ සහතිකය ලබා තිබීම;<br><br>හෝ<br><br>03.උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම් වලට සියළු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම;<br><br>සමඟ<br><br>අදාළ ක්ෂේත්‍රයේ වසර 05ක පළපුරුද්ද<br><br>(ඇ) පළපුරුද්ද<br><br>බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ ප්‍රාථමික හෝ ඉන් ඉහළ සේවා ගණයක ස්ථිර, දෙපාර්තමේන්තුගත තනතුරක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 10 ක සක්‍රීය හා සතුටුදායක සේවා පළපුරුද්දක් තිබීම. |
| ➢ **පුහුණු ශ්‍රේණිය (දෙවසරක පුහුණු කාලය)** | **(අ) අධ්‍යාපන සුදුසුකම්**<br><br>සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව , විද්‍යාව, ගණිතය යන විෂයයනට සම්මාන සාමාර්ථයන් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගය විෂයයන් හයකින් (06) සමත්වීම.<br><br>**(ආ) පළපුරුද්ද**<br><br>බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ ප්‍රාථමික හෝ ඉන් ඉහළ සේවා ගණයක ස්ථිර, දෙපාර්තමේන්තුගත තනතුරක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 10 ක සක්‍රීය හා සතුටුදායක සේවා පළපුරුද්දක් තිබීම. |

<u>සටහන</u>

i) III ශ්‍රේණියට ඍජුව බඳවා ගැනීම සහ පුහුණු ශ්‍රේණියට බඳවා ගැනීම යන ක්‍රම දෙකින්ම බඳවා ගන්නා විට බඳවා ගැනීමේ ශ්‍රේණිය වන III ශ්‍රේණියට පළමුව බඳවා ගනු ලැබේ.

ii) III ශ්‍රේණියට සුදුසුකම් ලබන අයදුම්කරුවන් සංඛ්‍යාව පුරප්පාඩු සංඛ්‍යාවට ප්‍රමාණවත් නොවන විට, ඉතිරි පුරප්පාඩු සඳහා පුහුණු ශ්‍රේණියට අදාළ සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් පුහුණු කිරීමේ ශ්‍රේණියට ඇතුළත් කර ගනු ලැබේ.

iii) පුහුණු ශ්‍රේණිය එක් වසරක පුහුණු කාලය හා දෙවසරක පුහුණු කාලය අවසානයේ පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයේ ලකුණු පදනම් කර ගනිමින් III ශ්‍රේණියට පත්කිරීමේ දී ජ්‍යෙෂ්ඨත්වය තීරණය කරනු ලබයි.

## 10. ලිඛිත තරග විභාගය පිළිබඳ විස්තර

❖ **පුහුණු කිරීමේ ශ්‍රේණිය (එක් වසරක පුහුණුව සඳහා) සහ III ශ්‍රේණිය සඳහා**

| විෂයය සහ විෂය නිර්දේශය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| **බුද්ධි පරීක්ෂණය** අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාවයත්, ඔහුගේ සිතීමේ විශ්ලේෂණ තත්ත්වයන් තීරණය කිරීමේ ශක්තියත්, විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් යුක්තය. | පැය 01 | 100 | 40% |
| **තාක්ෂණික හැකියාව** ගොඩනැගිලි, මාර්ග හා වාරිමාර්ග ඉදිකිරීමේ මූලධර්ම, ඉදිකිරීම් කාර්ය සඳහා පිඹුරුපත් සකස් කිරීම හා කියවා වටහා ගැනීමේ හැකියාව, ඇස්තමේන්තු පිළියෙල කිරීමේ හැකියාව, ජල සැපයීම, ජල ප්‍රවාහන ක්‍රියාමාර්ග හා අපද්‍රව්‍ය බැහැර කිරීමේ ක්‍රියා පිළිවෙල පිළිබඳව අපේක්ෂකයා සතු අත්පත් කර ගත යුතු හැකියාවන් විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් යුක්ත වේ. | පැය 03 | 100 | 40% |

❖ **පුහුණු කිරීමේ ශ්‍රේණිය (දෙවසරක පුහුණුව සඳහා)**

| විෂයය සහ විෂය නිර්දේශය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| **බුද්ධි පරීක්ෂණය** අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූල තාවයත්, ඔහුගේ සිතීමේ විශ්ලේෂණ තත්ත්වයන් තීරණය කිරීමේ ශක්තියත්, විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් යුක්තය. | පැය 02 | 100 | 40% |

## 11. විභාග ප්‍රතිඵල :-

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ප්‍රතිඵල දැන්වීම www.psc.wp.gov.lk වෙබ් අඩවිය මඟින් නිකුත් කරනු ඇත.

## 12. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :-

ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු - මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම හා කායික යෝග්‍යතාවය පරීක්ෂා කිරීම සඳහා පවත්වනු ලැබේ. ලකුණු ලබා දෙනු නොලැබේ.

**පත්කිරීම් බලධරයා - බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

## 13. විභාග ගාස්තු :-

සෑම අයදුම්කරුවෙකුම විභාග ගාස්තුවක් බස්නාහිර පළාත් සභාවට ගෙවිය යුතුය. විභාගය සඳහා විභාගය සඳහා විභාග ගාස්තුව රු. 1,200/= කි. මෙම විභාග ගාස්තුව බස්නාහිර පළාත් සභා ආදායම් ශීර්ෂ **20-03-02-99** ට බැර වන ලෙස අයදුම්පත්‍ර භාරගනු ලබන අවසාන දිනට හෝ ඊට ප්‍රථම බස්නාහිර පළාත තුළ පිහිටා ඇති ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදලින් ගෙවා ඔබගේ නමින් ලබා ගන්නා (බ.ප. 1) ලදුපත අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ අලවා තිබිය යුතුය. එහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. මෙම විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව කුමන කරුණක් නිසාවත් සම්පූර්ණයෙන්ම හෝ අර්ධ වශයෙන් හෝ ආපසු ගෙවනු නොලැබේ. තවද විභාග ගාස්තුව සඳහා මුද්දර හෝ මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.

**14. අයදුම් කළ යුතු පිළිවෙල:-**

I. සියලුම අයදුම්කරුවන් www.psc.wp.gov.lk යන බස්නාහිර පළාත් අපගේ නිල වෙබ් අඩවියට පිවිස මෙම විභාග නිවේදනය අනුව නිල වෙබ් අඩවියට උඩුගත (Upload) කර ඇති අයදුම්පත බාගත කිරීම සිදුකළ හැකිය.

II. අසම්පූර්ණ ලෙස තොරතුරු යොමු කර ඇති අයදුම්පත්, මූලික සුදුසුකම් සපුරා නොමැති අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරේ. සම්පූර්ණ කර එවනු ලබන අයදුම්පතෙහි ඡායා පිටපතක් අයදුම්කරු සතුව තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.

**III. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :-**

අයදුම්පතේ අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු ඔබ තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා සහතික කරවා ගත යුතු අතර අයදුම්පත ආයතන ප්‍රධානියා මගින් යොමු කළ යුතුය.

IV. මාර්ගගත ක්‍රමය ඔස්සේ අයදුම්පත් යොමු කළ හැකි අවසාන දිනය - **2026.05.10**

V. අපගේ නිල වෙබ් අඩවියට පිවිස මාර්ගගත ක්‍රමය මගින් **2026.05.10** දිනට ප්‍රථම අයදුම්පත් යොමු කිරීම සිදු කළ යුතු අතර, නිවැරදිව සම්පූර්ණ කර බාගත කර ගන්නා ලද අයදුම්පත් මෙම නිවේදනයට යා කොට ඇති ආදර්ශ ආකෘතියට අනුකූලව A4 ප්‍රමාණයේ කඩදාසියේ දෙපස භාවිතා කරමින් පිළියෙළ කර අපේක්ෂකයා තම අත් අකුරින්ම පැහැදිලිව පිරවිය යුතුය.

VI. සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය **2026.05.15** දිනට හෝ ඊට පෙර ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය:

ලේකම්,
බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
(බඳවා ගැනීම් අංශය),
අංක. 628, 10 වන මහල,
ජනජය සිටි ගොඩනැගිල්ල,
නාවල පාර, රාජගිරිය.

- අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරී (සිවිල්) III ශ්‍රේණිය, පුහුණු ශ්‍රේණිය (එක් වසරක පුහුණු කාලය), පුහුණු ශ්‍රේණිය (දෙවසරක පුහුණු කාලය) සඳහා බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය - 2026"** යන්න අනිවාර්යයෙන්ම සඳහන් කර තම ආයතන ප්‍රධානියා, දෙපාර්තමේන්තු ප්‍රධානියා, අමාත්‍යාංශ ලේකම් මගින් ඔවුන්ගේ නිර්දේශ සහිතව එවිය යුතු වේ. මෙදිනට පසුව ලැබෙන අයදුම්පත් භාර ගනු නොලැබේ.

VII. අයදුම්පතක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේදී නැති වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ. අවසාන දිනය දක්වා අයදුම්පත් ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි හානිය අයදුම්කරුවන් විසින් විඳදරා ගත යුතුය. එමෙන්ම අයදුම්පත් ලැබුණු බව දන්වනු නොලැබේ.

VIII. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් කිසිදු අයුරකින් සලකා බලනු නොලැබේ.

IX. මෙම නිවේදනයෙන් ආවරණය නොවන කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳව තීරණය කිරීමේ අයිතිය ද කිසියම් පුරප්පාඩුවලින් කොටසක් හෝ මුළුමනින්ම පිරවීම හෝ නොපිරවීම හෝ පිළිබඳව අවසන් තීරණය ගැනීමේ අයිතිය බස්නාහිර

පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ. එසේම මෙම බඳවාගැනීම කල් දැමීම, අවලංගු කිරීම හෝ පැවැත්වීමෙන් පසු තෝරා ගැනීම/ නොගැනීම පිළිබඳව අවසන් තීරණය බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

X. අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත පරිදි අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් පමණක් ලිඛිත පරීක්ෂණයන් සඳහා කැඳවනු ඇත. මේ සඳහා අයදුම් කරනු ලබන සියලුම අයදුම්කරුවන් සුදුසුකම් සම්පූර්ණ කර ඇතැයි උපකල්පනය කර ලිඛිත පරීක්ෂණය සඳහා සහභාගී වීමට අවස්ථාව දෙනු ලැබේ. ලිඛිත පරීක්ෂණය සඳහා සහභාගී වීමට අවස්ථාව ලබා දීම, සුදුසුකම් සම්පූර්ණ කර ඇති බවට පිළිගැනීමක් වශයෙන් නොසැලකිය යුතු ය. එසේ වුව ද අයදුම්කරු සුදුසුකම් සම්පූර්ණ කර නොමැති බව අනාවරණය වන ඕනෑම අවස්ථාවක දී අපේක්ෂකත්වය අවලංගු කිරීමට හා පත්වීම ලබා දීම ප්‍රතික්ෂේප කිරීමේ බලය බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

**15. විභාගයට ඇතුළත් කර ගැනීම :-**

(අ) විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් විසින් තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය පළමුවෙන්ම එම ශාලාවේ පෙනී සිටින විභාග දිනයේදී එහි විභාග මධ්‍යස්ථාන භාර ශාලාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එවැනි ප්‍රවේශ පත්‍රයක් ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ.

(ආ) අපේක්ෂකයෙකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදී ම විභාගයට පෙනී සිටිය යුතුය.

*සටහන* :- අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීම සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

**16. අපේක්ෂකයින්ගේ අනන්‍යතාව :-**

ප්‍රවේශ පත්‍රයක් නොමැති කිසිදු අයදුම්කරුවෙකුට විභාගයට පෙනී සිටීමට අවස්ථාව නොලැබේ. තවද, අයදුම්කරුවන් විභාග ශාලාව තුළ දී පෙනී සිටින සෑම ප්‍රශ්න පත්‍රයක් සඳහා ම විභාග ශාලාධිපති සෑහීමට පත් වන පරිදි ස්වකීය අනන්‍යතාවය ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් ලියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය:

(i) ජාතික හැඳුනුම්පත,
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය,
(iii) වලංගු රියදුරු බලපත්‍රය

විභාග අපේක්ෂකයින්ගේ අනන්‍යතාව තහවුරු කර ගත හැකිවන පරිදි මුහුණ හා ඉලෙක්ට්‍රෝනික සන්නිවේදන උපාංග පැළඳ ගෙන නොමැති බව සනාථ කිරීම සඳහා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තවද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

**17. සාවද්‍ය තොරතුරු සැපයීම :-**

මෙම විභාගයට ඉදිරිපත්වීම සඳහා කිසියම් අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ හෝ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. තවද, කිසියම් අපේක්ෂකයෙකු විසින් ඉදිරිපත් කරන ලද යම් තොරතුරක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කළ බව පෙනී ගියහොත් ඔහු හෝ ඇය සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කරනු ලැබේ.

i. අයදුම්පත පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයට අදාළ රෙගුලාසි අනුව කිසියම් අපේක්ෂකයෙකු ඊට පෙනී සිටීමට නුසුදුසු වෙතැයි පෙනී යන ලද නම්, විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ ඊට පසු හෝ යන කවර අවස්ථාවක දී වුව ද ඔහුගේ/ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය.

ii. අපේක්ෂකයෙකු විසින් සපයන ලද තොරතුරු පසු කලක දී වැරදි බව පෙනී ගියහොත් හෝ ඔහු/ඇය විසින් හිතාමතාම කිසියම් කරුණක් වසන් කරන ලද බව හෙළිවුවහොත් හෝ ඔහුට/ ඇයට පත්වීමක් ලබා දීම සම්බන්ධයෙන් තවදුරටත් සලකා බලනු නොලබන අතර, මෙම විභාගය හේතු කොට ගෙන දී තිබූ පත්වීමක් අහෝසි කිරීමට හෝ රජයේ සේවයෙන් පහ කිරීමට වුව ද යටත් වේ.

18. විභාගය පැවැත්වීම සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන ඕනෑම දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

19. විභාගය පැවැත්වීම, විභාගය අවලංගු කිරීම හෝ විභාගයේ ප්‍රතිඵල අත්හිටුවීම සහ ඊට අනුෂාංගිකව විභාග නිවේදනයේ විධිවිධාන සලසා නොමැති වෙනත් කවර හෝ කරුණක් සම්බන්ධයෙන් බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වන්නේය. සියලුම අයදුම්කරුවන් මෙම නිවේදනයේ සඳහන් නීති රීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

20. මෙම නිවේදනයේ සඳහන් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

තිලක් සෙනරත්,
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

2026 මාර්තු මස 27 දින,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.),
අංක: 628, 10 වන මහල,
ජනජය සිටි ගොඩනැගිල්ල,
නාවල පාර, රාජගිරිය.

(මෙම දැන්වීම පදනම් කරගෙන විවිධ ආයතන විසින් සාවද්‍ය ලෙස සකස් කර ඉදිරිපත් කරනු ලබන දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව කිසිදු වගකීමක් දරනු නොලැබේ.)

## ආදර්ශ අයදුම්පත්‍රය

## බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ (සිවිල්) III, පුහුණු ශ්‍රේණිය (එක් වසරක පුහුණු කාලය) සහ පුහුණු ශ්‍රේණිය (දෙවසරක පුහුණු කාලය) සඳහා බඳවා ගැනීමේ (සීමිත) තරඟ විභාගය - 2026

විභාග අංකය: ______

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

- නිවේදනයේ අංක 01 අනුව ඉල්ලුම්කරන තනතුරට අදාළ ශ්‍රේණිය (අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

III ශ්‍රේණිය - I
පුහුණු ශ්‍රේණිය (එක් වසරක)- II
පුහුණු ශ්‍රේණිය (දෙවසරක) - III

(මෙම ශ්‍රේණිය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ)

- ආබාධිත බව : ☐ (ආබාධිත අපේක්ෂකයකු නම් කොටුව තුළ √ ලකුණ යොදන්න.)
- විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය : (අදාළ අක්ෂරය කොටුව තුළ ලියන්න)

සිංහල - S
දෙමළ - T
ඉංග්‍රීසි - E

(අදාළ මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ)

**01** 1.1 සම්පූර්ණ නම(ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :
(උදා : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

1.2 මුලකුරු සමඟ අගට යෙදෙන නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්):
(උදා: H.M.S.K. GUNAWARDHANA)

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :

1.4 ජාතික හැඳුනුම්පත් අංකය :

**02** 2.1 ස්ත්‍රී/පුරුෂ භාවය :

**03** 3.1 විවාහක/අවිවාහක බව :

3.2 උපන් දිනය : වර්ෂය මාසය : දිනය :

3.3 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන **2026.05.10** දිනට වයස:

අවුරුදු ☐ මාස ☐ දින ☐

**04** 4.1 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්):

ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්):

4.2 විභාග ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය:

i. සිංහලෙන්/දෙමළෙන් :

ii. ඉංග්‍රීසි කැපිටල් අකුරින්:

4.3 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය:

4.4 බස්නාහිර පළාතේ ස්ථිරව පදිංචිව සිටින කාල සීමාව:

4.5 විද්‍යුත් තැපැල් ලිපිනය :

4.6 දුරකථන අංකය :

ස්ථාවර: | | | | | | | | | | | ජංගම: | | | | | | | | | | |

❖ විභාගය සම්බන්ධ සියලු තොරතුරු ඉහත සඳහන් කරනු ලබන ජංගම දුරකථන අංකයට SMS ක්‍රමය මගින් යවනු ලබන බැවින් වලංගු දුරකථන අංකයක් සඳහන් කරන්න. SMS පණිවිඩ නොලැබීම සම්බන්ධයෙන් පසුව කරනු ලබන පැමිණිලි සලකනු නොලැබේ.

**05**. 5.1 බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ දැනට දරන තනතුර:

5.2 එම තනතුරේ සේවය ස්ථිර කරන ලද දිනය:

(ස්ථිර කිරීමේ ලිපියේ සහතික කරන ලද පිටපතක් ඇමිණිය යුතුය)

5.3 අයදුම්පත් කැඳවන දිනට බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ දෙපාර්තමේන්තුගත ස්ථිර තනතුරක යටත් පිරිසෙයින් වසර (05) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබේද?
(දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් ඒ බව සනාථ කරන ලද සහතිකය ඇමිණිය යුතුය)

5.4 බස්නාහිර පළාත් පාලන චක්‍රලේඛ 04/2021 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා ඇති/නැති බව :-

**06.** පළපුරුද්ද (තනතුරට අදාළව අදාළ ක්ෂේත්‍රයේ වසර 05/10 ක පළපුරුද්ද) ....
(සනාථ කිරීමට සේවා සහතිකය ඇමිණිය යුතුය.)

**07.** **අධ්‍යාපන සුදුසුකම්** : (අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ අංක 09 අනුව ඉල්ලුම් කරන තනතුරට අදාළ සුදුසුකම් දැක්විය යුතු අතර ඡායා පිටපත් ඇමිණිය යුතුය.)

**7.1** අධ්‍යයන පොදු සහතික පත්‍ර **(සා.පෙළ)** පිළිබඳ විස්තරය:

| | | |
|---|---|---|
| i. **විභාගයේ වර්ෂය හා මාසය:** | **පළමු අවස්ථාව** | |
| | | |
| ii. **විභාග අංකය** | | |
| iii. **ප්‍රතිඵල** | **විෂයය** | **සාමාර්ථය** |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |

7.2 අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ අංක 09 ප්‍රකාරව මෙම විභාගයට පෙනී සිටීම සඳහා ඔබ ලබා ඇති වෘත්තීය සුදුසුකම් සම්බන්ධ පාඨමාලාව/ සුදුසුකම් පිළිබඳ විස්තර:

I. විශ්වවිද්‍යාලය/ ආයතනය :

II. පාඨමාලාවේ නම :

III. කාල සීමාව :

IV. පාඨමාලාව සම්පූර්ණ කළ දිනය :

V. වෙනත් සුදුසුකම් :

**(ඉහතින් දක්වා ඇති සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාළ වන සහතික/ ලේඛන අමුණන්න)**

**08.** විභාග ගාස්තු ගෙවූ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය : . ..........................................................................................

ලදුපත් අංකය : ........................................................

දිනය : ........................................................

මෙහි ලදුපත උඩුගත (UPLOAD) කරන්න

| ලදුපත මෙම කොටුව තුළ නොගැළවෙන සේ අලවන්න | ලදුපත UPLOAD කිරීමට හැකිවන සේ සකසන්න |
|---|---|

(ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදල් ගෙවා ලබාගන්නා ලද බ.ප. 1 ලදුපත පමණක් වලංගු වේ.)

**09.** <u>අයදුම්කරුගේ සහතිකය</u>

..........................................................................................................................................

.......................................................................... වන මා විසින් මෙම අයදුම්පතේ සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මා විසින් සපයා ඇති තොරතුරු සාවද්‍ය යැයි සොයාගනු ලැබුවහොත් බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරි (සිවිල්) III ශ්‍රේණියේ/ පුහුණු ශ්‍රේණිය (එක් වසරක)/ පුහුණු ශ්‍රේණිය (දෙවසරක) තනතුරට පත් කිරීම සඳහා වූ මාගේ හිමිකම නොසලකා හරිනු ලැබීමටද මට විරුද්ධව විනයානුකූලව කටයුතු කරනු ලැබීමටද හැකි බව මම හොඳාකාරව දනිමි. තව ද සම්මුඛ පරීක්ෂණය පැවැත්වීම සම්බන්ධයෙන් පනවනු ලබන නීතිරීති වලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

දිනය: .........................

..............................
අයදුම්කරුගේ අත්සන

**10.** <u>**අයදුම්කරුගේ අත්සන සහතික කිරීම**</u>

<u>**බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ දැනට සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**</u>

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ........................................................................................................... මයා/මිය/ මෙනවිය දැනට ................................................................ කාර්යාලයේ/ආයතනයේ .................................. දින සිට මේ දක්වා ...................................................... (තනතුර) වශයෙන් ස්ථිර/තාවකාලික/අනියම් (අනවශ්‍ය වචන කපා හරින්න) තනතුරක සේවය කරන බවද, ඔහුගේ/ඇයගේ සේවය සතුටුදායක බවද, මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා ඇය/ ඔහු තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරින් නිදහස් කරන බවද/නොකරන බවද, ඉහත සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බවද සහතික කරමි.

................................................
දිනය

.....................................................
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ
අත්සන
හා නිල මුද්‍රාව

11. <u>ප්‍රධාන ලේකම්වරයා (බ.ප.)/ අමාත්‍යාංශ ලේකම්වරයා (බ.ප.) ගේ නිර්දේශය</u>

ඉහත නිර්දේශය සමඟ එකඟ වෙමි/ නොවෙමි.

........................................
දිනය

..............................................................
ප්‍රධාන ලේකම්වරයා (බ.ප.)/අමාත්‍යාංශ ලේකම්වරයා (බ.ප.) ගේ
අත්සන හා නිල මුද්‍රාව

04-32/4

## බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරී (විදුලි) III ශ්‍රේණිය, පුහුණු ශ්‍රේණිය (එක් වසරක පුහුණු කාලය) සහ පුහුණු ශ්‍රේණිය (දෙවසරක පුහුණු කාලය) සඳහා බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2026

01. බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ පහත තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම බඳවා ගැනීමේ සීමිත තරග විභාගය, බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් ඉදිරි යෝජිත දිනයක දී පැවැත්වීමට නියමිතය. විභාගය පවත්වන දිනය පසුව දැනුම් දෙනු ලැබේ.

I. බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරී (විදුලි) III ශ්‍රේණිය
II. බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරී (විදුලි) (එක් වසරක පුහුණු කාලය)
III. බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරී (විදුලි) (දෙවසරක පුහුණු කාලය)

**02. පොදු සුදුසුකම් :-**

02.1 පත්වීම ස්ථිර කර තිබිය යුතුය.
02.2 නියමිත දිනට බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ දෙපාර්තමේන්තුගත ස්ථිර තනතුරක යටත් පිරිසෙයින් වසර පහ (05) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතු අතර ඒ බව දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කර තිබීම.
02.3 බස්නාහිර පළාත් පාලන චක්‍රලේඛ 04/2021 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.
02.4 සේවයට බඳවා ගැනීම සඳහා වන ලිඛිත පරීක්ෂණයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ නිලධාරියා සියළු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.
02.5 අයදුම්කරු බස්නාහිර පළාත තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

**03. වයස් සීමාව** :- දැනටමත් බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ නියුතු වූවන්ගෙන් බඳවා ගන්නා බැවින් වයස් සීමාවක් අදාළ නොවේ.

**04. සේවා කොන්දේසි :-**

(අ) 2019.08.15 දිනැතිව බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරී (විදුලි) තනතුරට බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියේ පනවා ඇති නියමයන් හා කොන්දේසි වලට ද, එම බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියේ කර ඇති හෝ මින්මතු කෙරෙන සංශෝධනවලට ද යටත් වේ.

(ආ) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. තවද ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය මඟින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි විධිවිධානවලට ද, අංක 2364/32 සහ 2023.12.29 වැනි දින දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලට ද, චක්‍රලේඛ හා උපදෙස්වලටද, ඒවාට අදාළ වරින් වර නිකුත් කරනු ලබන සංශෝධනවලටද යටත් විය යුතු වේ.

**05. පුරප්පාඩු ප්‍රමාණය :- 09**

**06. පවත්නා පුරප්පාඩු ක්ෂේත්‍රයන් :-**

ඉහත සඳහන් තනතුරුවල පුරප්පාඩු සඳහා බඳවා ගැනීම සම්බන්ධයෙන් අවසාන තීරණය බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

6.1 අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනය **2026.05.10** දින වේ. අයදුම් කරන තනතුරට අදාළ සියලු සුදුසුකම් **2026.05.10** දින හෝ එදිනට පෙර සම්පූර්ණ කර තිබිය යුතුයි.

**07.** බඳවා ගැනීමේ ක්‍රමය :

- ලිඛිත තරග විභාගයක සහ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුස්සන් තෝරනු ලැබේ.

- ලිඛිත තරග විභාගයේ ප්‍රතිඵල අනුව සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා වන සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවන අයදුම්කරුවන් නියමිත දිනයේදී සහභාගී නොවීම සම්බන්ධයෙන් කිසිදු අයුරකින් නැවත සලකා බලනු නොලැබේ. එමෙන්ම සම්මුඛ පරීක්ෂණ දිනට සියළු සහතික ඉදිරිපත් කළ යුතු අතර, එදිනට පසුව ඉදිරිපත් කරනු ලබන කිසිදු සහතික භාර ගනු නොලැබේ.

- පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය පත්වීම් බලධරයා විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීමට පත්වීම් බලධරයාට බලය ඇත. කිසියම් අවස්ථාවක පුරප්පාඩු සම්පූර්ණ කරන කඩඉම් ලකුණේ සම ලකුණු ලබා ගත් අයදුම්කරුවන් කිහිප දෙනෙක් සිටින අවස්ථාවක එම පුරප්පාඩු සංඛ්‍යාව පිරවීම සඳහා කඩඉම් ලකුණේ සම ලකුණු ලබා ගත් අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයකට ලක් කර එහි කුසලතාව මත එම පුරප්පාඩු ප්‍රමාණය සම්පූර්ණ කරනු ලැබේ.

- සීමිත තරග විභාගයෙන් බඳවා ගැනීමට නියමිත ප්‍රතිශතය සඳහා ප්‍රමාණවත් මූලික සුදුසුකම් සහිත අභ්‍යන්තර අයදුම්කරුවන් අදාළ දෙපාර්තමේන්තුව/ අමාත්‍යාංශය තුල නොසිටී නම් පමණක් ඉතිරි ප්‍රමාණය විවෘත තරග විභාගය මගින්ම තෝරා ගන්නා බාහිර අයදුම්කරුවන්ගෙන්ම සම්පූර්ණ කර ගනු ලැබේ.

- පුහුණු කාලසීමාව අවසානයේදී III ශ්‍රේණියට බඳවා ගැනීම-

  (අ) විවෘත ධාරාව හෝ සීමිත ධාරාව හෝ යටතේ පුහුණු කිරීමේ ශ්‍රේණියට ඇතුලත් කරගනු ලබන අයදුම්කරුවන් අදාළ බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් පුහුණු කාලසීමාව සාර්ථක ලෙස සම්පූර්ණ කිරීමෙන් අනතුරුව බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන විභාගය සමත් වීමෙන් පසු සේවයේ III ශ්‍රේණියට බඳවා ගනු ලැබේ.

  (ආ) පුහුණුව අවසානයේ පවත්වනු ලබන විභාගය සමත් වීමට අපොහොසත් වන ආධුනිකයින් වෙතොත් ඔවුනට මාස 06 කට නොවැඩි කාලයක් සඳහා සිය පුහුණු කාලය දීර්ඝ කරවා ගැනීමට අවස්ථාව ඇත. එසේ දීර්ඝ කරනු ලබන කාල සීමාව අවසානයේ නැවත පවත්වනු ලබන විභාගය අසමත් වන විවෘත ධාරාව යටතේ අයදුම්කල ආධුනිකයන්ගේ සේවය අවසන් කරනු ලැබේ.

08. මාසික වැටුප් පරිමාණය :

- III ශ්‍රේණිය MN 03 – 2025
  රු. 52,250 - 10 X 800 - 11X 1,190- 10 X 1,320 -10X1,350 - රු. 100,040/-

  (රා.පරි.ච. 10/2025 හි උපලේඛන III අනුව ගෙවනු ලැබේ.)

- පුහුණු ශ්‍රේණිය (එක් වසරක පුහුණු කාලය) - 2026.01.01 දිනට වන මාසික දීමනාව රු. 43,274/-

- පුහුණු ශ්‍රේණිය (දෙවසරක පුහුණු කාලය) - 2026.01.01 දිනට වන මාසික දීමනාව රු. 43,730/-

(මාසික දීමනා රා.පරි.ච.10/2025 හි උපලේඛන VI අනුව ගෙවනු ලැබේ.)

**09. මූලික සුදුසුකම් :-**

| තනතුර | සුදුසුකම් |
|---|---|
| **බස්නාහිර පළාත් සහා රාජ්‍ය සේවයේ තාක්‍ෂණ සේවයේ (විදුලි)**<br>➢ III ශ්‍රේණිය (**සෘජු බඳවා ගැනීම**) | <u>(අ) අධ්‍යාපන සුදුසුකම්</u><br>සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව , විද්‍යාව, ගණිතය යන විෂයයනට සම්මාන සාමාර්ථයන් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගය විෂයයන් හය (06) කින් සමත්වීම.<br><br><u>(ආ) වෘත්තීය සුදුසුකම්</u><br>1. මොරටුව විශ්ව විද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්‍ෂණික (විදුලි) ඩිප්ලෝමාව;<br>හෝ<br>2. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව (විදුලි);<br>හෝ<br>3. අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව (විදුලි);<br>හෝ<br>4. ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්‍ෂණික ඩිප්ලෝමාව (විදුලි);<br>හෝ<br>5. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ පළමු වන කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම;<br>හෝ<br>6. රැකියා ක්ෂේත්‍රයට අදාලව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 06 වන මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම;<br><br>7. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්‍ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්‍ෂණික සුදුසුකම් වලට සියළු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්‍ෂණික සුදුසුකම් ලබා තිබීම.<br><br><u>(ඇ) පළපුරුද්ද</u><br>බස්නාහිර පළාත් සහා රාජ්‍ය සේවයේ ප්‍රාථමික හෝ ඉන් ඉහළ සේවා ගණයක ස්ථිර, දෙපාර්තමේන්තුගත තනතුරක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් **වසර 05 ක** සක්‍රීය හා සතුටුදායක සේවා පළපුරුද්දක් තිබීම. |
| ➢ පුහුණු ශ්‍රේණිය (එක් වසරක පුහුණු කාලය) | <u>(අ) අධ්‍යාපන සුදුසුකම්</u><br>සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව , විද්‍යාව, ගණිතය යන විෂයයනට සම්මාන සාමාර්ථයන් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගය විෂයයන් හය කින් (06) සමත්වීම. |

| තනතුර | සුදුසුකම් |
|---|---|
| ➢ පුහුණු ශ්‍රේණිය (එක් වසරක පුහුණු කාලය) | (ආ) **වෘත්තීය සුදුසුකම්**<br><br>1.තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක විදුලි ක්ෂේත්‍රයේ වසර 03 ක පාඨමාලාවක් සාර්ථකව හදාරා ජාතික තාක්ෂණ සහතිකය (විදුලි) ලබා තිබීම;<br>හෝ<br><br>2. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක විදුලි ක්ෂේත්‍රයේ කර්මාන්ත තාක්ෂණිකයන් සඳහා වූ වසර 02 ක ජාතික සහතික පත්‍ර පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර අදාල සහතිකය ලබා තිබීම;<br>හෝ<br><br>3. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියළු අතින් සමාන යැයි තෘතියීක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම;<br>සමඟ<br><br>අදාළ ක්ෂේත්‍රයේ වසර 05ක පළපුරුද්ද<br><br>(ඇ) **පළපුරුද්ද**<br><br>බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ ප්‍රාථමික හෝ ඉන් ඉහල සේවා ගණයක ස්ථිර, දෙපාර්තමේන්තුගත තනතුරක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 10 ක සක්‍රිය හා සතුටුදායක සේවා පළපුරුද්දක් තිබීම. |
| ➢ පුහුණු ශ්‍රේණිය (දෙවසරක පුහුණු කාලය) | (අ) **අධ්‍යාපන සුදුසුකම්**<br><br>සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව , විද්‍යාව, ගණිතය යන විෂයයනට සම්මාන සාමාර්ථයන් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගය විෂයයන් හය (06) කින් සමත්වීම.<br><br>(ආ) **පළපුරුද්ද**<br><br>බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ ප්‍රාථමික හෝ ඉන් ඉහල සේවා ගණයක ස්ථිර, දෙපාර්තමේන්තුගත තනතුරක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 10 ක සක්‍රිය හා සතුටුදායක සේවා පළපුරුද්දක් තිබීම. |

සටහන

(i) III ශ්‍රේණියට සෘජුව බඳවා ගැනීම සහ පුහුණු ශ්‍රේණියට බඳවා ගැනීම යන ක්‍රම දෙකින්ම බඳවා ගන්නා විට බඳවා ගැනීමේ ශ්‍රේණිය වන III ශ්‍රේණියට පළමුව බඳවා ගනු ලැබේ.

(ii) III ශ්‍රේණියට සුදුසුකම් ලබන අයදුම්කරුවන් සංඛ්‍යාව පුරප්පාඩු සංඛ්‍යාවට ප්‍රමාණවත් නොවන විට, ඉතිරි පුරප්පාඩු සඳහා පුහුණු ශ්‍රේණියට අදාළ සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් පුහුණු කිරීමේ ශ්‍රේණියට ඇතුළත් කර ගනු ලැබේ.

(iii) පුහුණු ශ්‍රේණිය එක් වසරක පුහුණු කාලය හා දෙවසරක පුහුණු කාලය අවසානයේ පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයේ ලකුණු පදනම් කර ගනිමින් III ශ්‍රේණියට පත්කිරීමේදී ජ්‍යෙෂ්ඨත්වය තීරණය කරනු ලබයි.

## 10. ලිඛිත තරග විභාගය පිළිබඳ විස්තර

❖ පුහුණු කිරීමේ ශ්‍රේණිය (එක් වසරක පුහුණුව සඳහා) සහ III ශ්‍රේණිය සඳහා

| විෂයය සහ විෂය නිර්දේශය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| **බුද්ධි පරීක්ෂණය**<br>අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූල තාවයත්, ඔහුගේ සිතීමේ විශ්ලේෂණ තත්ත්වයන් තීරණය කිරීමේ ශක්තියත්, විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් යුක්තය. | පැය 01 | 100 | 40% |
| **විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය**<br><br>*ප්‍රතිරෝධ *ධාරිත්‍රක *ඩයෝඩ අදාළ මූලධර්ම - ස්ථිති විද්‍යුතය, විද්‍යුත් චුම්බකත්වය, විද්‍යුත් චුම්බක ක්ෂේත්‍රවල මූලික සංකල්ප සංවර්ධනය, සන්නායකවල සරල පද්ධති ධාරිතා බලය සහ ස්වීය අන්‍යොන්‍ය ප්‍රේරණ, සංගුණකය, විද්‍යුත් චුම්බක ආකෘතියේ ප්‍රේරිත විද්‍යුත් ගාමක බලය, තනිකලා පරිනාමකයන්ගේ මූලික ප්‍රතිපත්ති සමඟ පරිපථ හා දෛශික රූප සටහන්, සරල ධාරා ශ්‍රේණි, උපපථ හා සංයුක්ත ජනකය සහ මෝටර් යන්ත්‍ර පිළිබඳ මූලික ක්‍රියාකාරී ලක්ෂණ, ආමේචර් ප්‍රතික්‍රියාව හා කාන්දු ප්‍රතිබාධකය, මෝටර් යන්ත්‍ර සැර දැමීමේ මූලධර්ම, සමාන්තර ක්‍රියාකාරී පරිවර්ථන හා ජනක ප්‍රත්‍යාවර්ථන සමකාලීන කිරීම.<br>*විදුලිය රැහැන් ඇදීම (තනිකලා හා තෙකලා)<br>* විදුලිය පද්ධතියක ආරක්ෂණ ක්‍රම<br>* ක්ෂමතාවය හා ජවසාධකය දියුණු කිරීම යන විෂයන්ගෙන් සමන්විත ප්‍රශ්නාවලියකින් යුක්තය. | පැය 03 | 100 | 40% |

❖ පුහුණු කිරීමේ ශ්‍රේණිය (දෙවසරක පුහුණුව සඳහා)

| විෂයය සහ විෂය නිර්දේශය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| **බුද්ධි පරීක්ෂණය**<br>අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූල තාවයත්, ඔහුගේ සිතීමේ විශ්ලේෂණ තත්ත්වයන් තීරණය කිරීමේ ශක්තියත්, විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් යුක්තය. | පැය 02 | 100 | 40% |

## 11. විභාග ප්‍රතිඵල :-

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ප්‍රතිඵල දැන්වීම www.psc.wp.gov.lk වෙබ් අඩවිය මඟින් නිකුත් කරනු ඇත.

## 12. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :-

ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු - මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම හා කායික යෝග්‍යතාවය පරීක්ෂා කිරීම සඳහා පවත්වනු ලැබේ. ලකුණු ලබා දෙනු නොලැබේ.

**පත්කිරීම් බලධරයා - බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

## 13. විභාග ගාස්තු :-

සෑම අයදුම්කරුවෙකුම රු. 1,200.00 ක විභාග ගාස්තුවක් බස්නාහිර පළාත් සභාවට ගෙවිය යුතුය. මෙම විභාග ගාස්තුව බස්නාහිර පළාත් සභා ආදායම් ශීර්ෂ **20-03-02-99** ට බැර වන ලෙස අයදුම්පත්‍ර භාරගනු ලබන අවසාන දිනට හෝ ඊට ප්‍රථම බස්නාහිර පළාත තුළ පිහිටා ඇති ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදලින් ගෙවා ඔබගේ නමින් ලබා ගන්නා (බ.ප. 1)

ලදුපත අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ අලවා තිබිය යුතුය. එහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. මෙම විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව කුමන කරුණක් නිසාවත් සම්පූර්ණයෙන්ම හෝ අර්ධ වශයෙන් හෝ ආපසු ගෙවනු නොලැබේ. තව ද විභාග ගාස්තුව සඳහා මුද්දර හෝ මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.

**14. අයදුම්කළ යුතු පිළිවෙළ:-**

I. සියලුම අයදුම්කරුවන් www.psc.wp.gov.lk යන බස්නාහිර පළාත් අපගේ නිල වෙබ් අඩවියට පිවිස මෙම විභාග නිවේදනය අනුව නිල වෙබ් අඩවියට උඩුගත (Upload) කර ඇති අයදුම්පත බාගත කිරීම සිදුකළ හැකිය.

II. අසම්පූර්ණ ලෙස තොරතුරු යොමු කර ඇති අයදුම්පත්, මූලික සුදුසුකම් සපුරා නොමැති අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරේ. සම්පූර්ණ කර එවනු ලබන අයදුම්පතෙහි ජායා පිටපතක් අයදුම්කරු සතුව තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.

**III. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :-**

අයදුම්පතේ අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු ඔබ තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා සහතික කරවා ගත යුතු අතර අයදුම්පත ආයතන ප්‍රධානියා මඟින් යොමු කළ යුතුය.

IV. මාර්ගගත ක්‍රමය ඔස්සේ අයදුම්පත් යොමු කළ හැකි අවසාන දිනය - **2026.05.10**

V. අපගේ නිල වෙබ් අඩවියට පිවිස මාර්ගගත ක්‍රමය මඟින් **2026.05.10** දිනට ප්‍රථම අයදුම්පත් යොමු කිරීම සිදුකළ යුතු අතර, නිවැරදිව සම්පූර්ණ කර බාගත කර ගන්නා ලද අයදුම්පත් මෙම නිවේදනයට යා කොට ඇති ආදර්ශ ආකෘතියට අනුකූලව A 4 ප්‍රමාණයේ කඩදාසියේ දෙපස භාවිතා කරමින් පිළියෙළ කර අපේක්ෂකයා තම අත් අකුරින්ම පැහැදිලිව පිරවිය යුතුය.

VI. සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය **2026.05.15** දිනට හෝ ඊට පෙර ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

ලේකම්,
බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
(බඳවා ගැනීම් අංශය),
අංක 628, 10 වන මහල,
ජනජය සිටි ගොඩනැගිල්ල,
නාවල පාර, රාජගිරිය.

